

වාර්ෂික වාර්තාව

2020





© DMC 2020

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

විද්‍යා මාවත,

කොළඹ 07.

වෙබ් අඩවිය
www.dmc.gov.lk

විද්‍යුත් තැපෑල
info@dmc.gov.lk

හදිසි ඇමතුම්
011 213 6222
011 267 0002
117





ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

Disaster Management Centre

පටුන

1 හැඳින්වීම 1

1.1 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සහාව 1

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා 2

2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක් 3

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ 3

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් 3

2.3 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC) 4

2.4 විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) 5

2.5 විගණන විමසුම හා ආපදා කළමනාකරණ කමිටුව 6

2.6 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල විස්තරය 7

2.6.1 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක 7

2.7 2020 වර්ෂයේ ඇති වූ ආපදා තත්ත්වයන් පිළිබඳ විග්‍රහය 8

2.7.1 ආපදාවල බලපෑම විශ්ලේෂණය 2020 8

3 ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම් 12

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම 12

3.2 බහුවිධ ආපදා අවදානම අවම කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (MHEW 2020) 12

3.3 ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සමගාමීව පැවැත්වූ ජාතික මට්ටමේ චිත්‍ර තරඟය 14

3.4 ජාතික මට්ටමේ වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම 16

3.5 කොවිඩ් 19 (Covid 19) වෛරසය මැඩලීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දායකත්වය 17

4 2020 වර්ෂයේදී තාක්ෂණික අංශවල ප්‍රගතිය 18

4.1 පෙර සූදානම් හා සැලසුම් අංශය 19

4.1.1 දිස්ත්‍රික් මට්ටමේ පෙර සූදානම් සැලසුම් 19

4.1.2 දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය ආපදා කළමනාකරණ සැලසුම් 20

4.1.3 ආපදා පෙර සූදානම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් 20

4.1.4 අවදානම් ප්‍රදේශවල දැන්වීමේ පුවරු සවි කිරීම 20

4.1.5 බුරවි සුලි කුණාටුව සඳහා සූදානම 21

4.1.6 ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන - IOWAVE 20 21

4.1.7 මෝසම් පෙර සූදානම් වැඩසටහන් 22

4.1.8 පාසල් ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම 23

4.2 පුහුණු හා දැනුවත් කිරීමේ අංශය 23

4.2.1 ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 24

4.2.2 ත්‍රිවිධ හමුදා, පොලිස් නිලධාරීන් හා අනෙකුත් පාර්ශවකාර ආයතන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 25

4.2.3 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 26

4.2.4 දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 30

4.2.5 ජාතික සුරක්ෂිත දින වැඩසටහන 31

4.2.6 කාර්යය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන් 32

4.3 අවම කිරීම, පර්යේෂණ හා සංවර්ධන අංශය 34

4.3.1 අංශය මඟින් සිදුකරනු ලබන වෙනත් ක්‍රියාකාරකම් 35

4.3.2 2020 වර්ෂයේ ප්‍රගතිය 35

4.3.3 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 36

4.3.4 නව ව්‍යාපෘති 37

4.3.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවස්ථා 37

4.3.6 ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම 38

4.3.7 ආපදා අවදානම් තක්සේරුව 39

4.3.8 ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම 42

4.3.9 Desinventar දත්ත ගබඩාව 43

4.3.10 Riskinfo අවදානම් තොරතුරු වෙබ් අඩවිය 43

4.3.11 දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම 45

4.3.12 වෙනත් ව්‍යාපෘතීන් 45

4.4 හදිසි මෙහයුම් මධ්‍යස්ථානය 46

4.4.1 2020 වසරේ සිදුවූ ආපදා හා සිදුකරන ලද හදිසි මෙහෙයුම් 47

4.4.2 පූර්ව දැනුම්දීම් 52

4.4.3 ඇමතුම් මැදිරිය 52

4.4.4 හදිසි මෙහෙයුම් අංශය මඟින් සිදුකරනු ලබන අනෙකුත් කාර්යයන් 54

4.5 මූල්‍ය අංශය 57

4.5.1 2020 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය ප්‍රගතිය 57

5 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව 89

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක ආයතනය ලෙස, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතෙහි 8 වන වගන්තිය ප්‍රකාරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමෙන් ක්‍රමෝපායික මඟපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය, ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව වෙත පැවරී ඇති අතර, රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඒ සඳහා මඟපෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමුවෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්ය රාමුවක් බවට 2005 අංක 13 දරන මෙම පනත පත්විය.

මෙම පනත මඟින් පිහිටුවන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වනුයේ, ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනිකුත් ප්‍රධාන ආයතන හා එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ආපදා ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

1.1 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් නීතිමය ප්‍රතිපාදන අනුව ව්‍යසන කළමනාරකරණය සඳහා වූ ජාතික සභාව 2005 වසරේ දී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරාගත් විෂයයන් භාරව සිටින ගරු අමාත්‍යවරු, පළාත් ප්‍රධාන අමාත්‍යවරු (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුන්ගෙන් යුතු කණ්ඩායමකි.
(සටහන 1.1)

ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ සංයුතිය



සටහන 1.1: ජාතික සභාවේ සංයුතිය

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා

2005 අංක 13 දරන පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයෑම්
- සුළි සුළඟ
- ගං වතුර
- නියඟය
- කාර්මික ආපදා
- සුනාමි
- භූමි කම්පා
- ගුවන් උවදුරු
- සමුද්‍රීය උපද්‍රවයන්
- ගිනි
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි ගිගුරුම් සහිත කුණාටු
- වසංගත තත්වයන්
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගල
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනිගැනීම්
- වෙරළ බාදනය

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ජාතික වගකීම වන්නේ, ඇතිවිය හැකි ඕනෑම ආපදා තත්වයක් කාර්යක්ෂමව කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කරමින් සුරක්ෂිත ප්‍රජාවක් ඇති කිරීමයි. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ නායකත්වය යටතේ අංශ හතකින් සමන්විතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාවලිය සකස් වී ඇත.
ඒ අනුව එහි ප්‍රධාන අංශ පහත සඳහන් වේ.

1. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පෙර සූදානම් හා සැලසුම් අංශය
3. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය
4. හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය
5. මානව සම්පත් හා පරිපාලන අංශය
6. මූල්‍ය අංශය
7. අභ්‍යන්තර විගණන අංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ජාතික වගකීම දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සෑම දිස්ත්‍රික්කයක් තුළම ස්ථාපිත කර ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රටතුළ ක්‍රියාත්මක කෙරේ.

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

<u>දැක්ම</u>

සුරක්ෂිත ප්‍රජාවක් සහ තිරසාර සංවර්ධනයක්.

<u>මෙහෙවර</u>

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන හදිසි ආපදා තත්වයන් ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව තුළත් පොදුවේ පවුල් ඒකක තුළත් සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැගීම.

<u>අභිමතාර්ථ</u>

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයන් තුළින් පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීම්,

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.
- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.

- පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා පෙර සූදානම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් ලබාදීම හා ප්‍රචාරණය.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෙවීම් සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම් ව්‍යුහාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අවම කිරීම සඳහා සංවර්ධන ප්‍රවාහයට ආපදා අවදානම් අන්තර්ගත කිරීම.
- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන දේශීය සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2.3 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණමය කටයුතු සම්බන්ධව තීරණ ගන්නා වූ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය අන්තර්කාලීන කළමනාකරණ කමිටුව නම් වේ. එය ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අතර 2020 වර්ෂය තුළදී රැස්වීම්වාර 3ක් පවත්වා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම් ජෙනරාල් ජී.ඩී.එච්.කමල් ගුණරත්න(විශ්‍රාමික) ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී	-	සභාපති
අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මේජර් ජෙනරාල් එස්.රණසිංහ(විශ්‍රාමික)ආර්ඩබ්පී ආර්එස්පී එම්එස්සී එන්ඩියු පීඑස්සී	-	ලේකම්
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ නියෝජිතයෙක් ඒ.එන්.අමරතුංග මහත්මිය, අධ්‍යක්ෂ	-	සාමාජික
ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ආර්.එම්.පී.එස්.රත්නායක මහතා, අතිරේක ලේකම්	-	සාමාජික
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ නියෝජිතයෙක් එම්.ඒ.එස්.මහේෂි මහත්මිය, අතිරේක ලේකම්	-	සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ආචාර්ය ආසිරි කරුණාවර්ධන මහතා	-	සාමාජික
ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී එච්.යූ.ආර්.ෆොන්සේකා මහතා	-	සාමාජික

2.4 විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)

2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ සංයුතිය පහත දැක්වේ.

ඒ.එන්. අමරතුංග මිය - (සභාපති)	-	අධ්‍යක්ෂ, භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය.
මේජර් ජෙනරාල් එස්. රණසිංහ මහතා (විශ්‍රාමික)	-	(ලේකම්) - අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
ආර්.එම්.පී.එස්. රත්නායක මහතා (සාමාජික)	-	අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති), ආරක්ෂක අමාත්‍යාංශය.
එච්.යූ.ආර්. ෆොන්සේකා මහතා (සාමාජික)	-	ප්‍රධාන ගණකාධිකාරී, ආපදා කළමනාකරණ අංශය
කේ.ඒ.එස්. මහේෂි මහත්මිය (සාමාජික)	-	අතිරේක ලේකම් (සංවර්ධන), පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය.
ඒ.බී.ආර්. අමරකෝන් මහත්මිය (නිරීක්ෂක)	-	විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය
ජේ.එච්.පී. ජයලත් මහතා (සම්බන්ධීකාරක)	-	අභ්‍යන්තර විගණක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක.

ජාතික විගණන කාර්යාලයෙන් හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශයෙන් නිකුත් කර තිබූ විගණන විමසුම්වලින් මතුකර ඇති නිරීක්ෂණ පිළිබඳව මෙහි දී සාකච්ඡාවට භාජනය කර ඇත. විශේෂයෙන්ම අභ්‍යන්තර විගණක විසින් 2020 වර්ෂය සඳහා සකස් කර තිබූ අවදානම් පදනම් කරගත් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය, පාලන ක්‍රියාවලිය හා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අදාළව මතුකර තිබූ විගණන නිරීක්ෂණ මෙම කමිටුවේ දී වැඩි දුරටත් විශ්ලේෂණය කරමින් ආයතනයේ අරමුණු ලඟාකර ගැනීම සඳහා ඉවහල් වන පරදි විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ ලබා දී ඇත.

ඒ අනුව මුදල් රෙගුලාසි 133 හා 134 දැක්වෙන කාර්යභාරයන්, කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛණවල දැක්වෙන උපදෙස්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හා ජාතික විගණන පනතේ නියමයන්ට අනුව විගණන හා කළමනාකරණ කමිටුවේ දී කරුණු සාකච්ඡා කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අරමුණු ලඟාකර ගැනීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකාරිත්වය වෙත අවශ්‍ය මඟපෙන්වීම් සිදුකර ඇත. එමෙන්ම, විගණන විමසුම් හා වාර්තාවලින් මතුකරන නිරීක්ෂණ හා විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ සඳහා මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන නිවැරදි කරගැනීම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳව ද මෙහිදී වැඩිදුරටත් කරුණු සොයා බලා ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2020 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වා අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් කළමනාකාරිත්වය වෙත යොමු කර ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවට අදාළව ශ්‍රී ලංකාවේ සම්පත්වලට මූලිකත්වය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් භාර ගන්නා ලද ව්‍යාපෘති, වැඩසටහන් හා කාර්යභාරයන්වල පූර්ව නිශ්චය කර ගත් අරමුණු ලභා කර ගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිතා කර ඇති බවට සහතික වීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සෑම කළමනාකරණ අංශයක් ම සමාලෝචනය කිරීම සිදු කිරීම සහ එකී ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද අරමුදල් වියදම් කිරීම සඳහා, අවසර ලත් කාල සීමාව තුළ එකී පරමාර්ථ සැබෑවටම අත්කර ගෙන තිබේ ද යන්න සහ නිම කළ ව්‍යාපෘති හෝ වැඩසටහන්, සැලසුම්වලින් අපේක්ෂිත වූ පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න නිර්ණය කිරීම සිදු කිරීම පැවරී ඇති අතර එම කාර්යයන් ඉදිරි වර්ෂවලදී ද මනාව සිදු කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සැලසුම් කර ඇත.

2.5 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

සටහන 2.1හි දක්වා ඇති පරිදි ආපදා කළමනාරණ මධ්‍යස්ථානය විසින් ඉටුකරනු ලබන විවිධ කාර්යයන් හා වැඩසටහන් සැලකිල්ලට ගනිමින් මෙම ආයතනික ව්‍යුහය සකස් කර ඇත.



සටහන 2.1: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

2.6 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල විස්තර

වගුව 2.1: 2020.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	01	01	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01	01	0
අධ්‍යක්ෂ	06	04	02
අභ්‍යන්තර විගණක	01	01	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ	18	0	18
සහකාර අධ්‍යක්ෂ	15	12	03
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	25	24	01
ගිණුම් නිලධාරී	01	01	0
පරිපාලන නිලධාරී	01	0	01
පුද්ගලික සහකාර	01	0	01
විමර්ශන නිලධාරී	01	01	0
දුර දැනීම/භූ තොරතුරු දත්ත පද්ධති විශ්ලේෂක	01	01	0
දත්ත පද්ධති විශ්ලේෂක	01	01	0
තොරතුරු තාක්ෂණ නිලධාරී	01	0	01
ජාල පද්ධති පරිපාලක	01	0	01
පුස්තකලයාධිපති	01	0	01
සංවර්ධන නිලධාරී	101	0	101
භාෂා පරිවර්තක	02	0	02
තොරතුරු තාක්ෂණ සහකාර	06	06	0
චලන හා නිශ්චල කැමරා ශිල්පී	01	01	0
සන්නිවේදන කාර්මික ශිල්පී	03	02	01
ගුවන් විදුලි ක්‍රියාකරු	01	01	0
කළමනාකරණ සහකාර / ආපදා කළමනාකරණ සහකාර	201	178	23
රියදුරු	39	37	02
කාර්යාල කාර්යය සහායක	35	33	02
එකතුව	**465**	**305**	**160**

2.6.1 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

මෙම ඒකක දිස්ත්‍රික් 25 තුළම පිහිටුවා ඇත. මෙම එක් එක් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයෙකු සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන්ගෙන්, ආපදා කළමනාකරණ සහකාරවරුන්ගෙන්, කළමනාකරණ සහකාරවරුන්ගෙන්, කාර්යාල සහායකවරුයෙකු මෙන්ම රියදුරුවරයෙකුගෙන් ද සමන්විත වේ.

දිස්ත්‍රික්කය ආපදාවලට භාජනය වීමට ඇති නැඹුරුතාවය අනුව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහායකයින් සංඛ්‍යාව වෙනස් වේ. මුළු එකතුව ගත් කල සහකාර අධ්‍යක්ෂවරුන් (දිස්ත්‍රික්) 25 දෙනෙකු සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන්, ආපදා කළමනාකරණ සහකාරවරුන්, කළමනාකරණ සහකාරවරුන් ඇතුළුව 113 දෙනෙකු දිස්ත්‍රික්ක 25හි සේවය සඳහා යොදවා ඇත.

කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක යුධ හමුදා සහ ගුවන් හමුදා නිලධාරීන්ගේ පරිපාලනය යටතේද සෙසු දිස්ත්‍රික් ඒකක සිවිල් නිලධාරීන්ගේ පරිපාලනය යටතේද ක්‍රියාත්මක වේ.

කළුතර දිස්ත්‍රික්කය හැර සෙසු දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ස්ථාපිත කර තිබේ. රූප සටහන 2.2හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය දැක්වේ.



සටහන 2.2: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය

2.7 2020 වර්ෂයේ ඇති වූ ආපදා තත්වයන් පිළිබඳ විග්‍රහය

2.7.1 ආපදාවල බලපෑම් විශ්ලේෂණය - 2020

i. සමස්ත බලපෑම - 2020

2020 වසරේ දී නියඟය, ගංවතුර, නායයෑම්, කණ්ඩි කඩා වැටීම්, දැඩි සුළං, ගිණි ගැනීම්, අකුණු අනතුරු යනාදියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 784,933ක් පමණ වේ. නියඟය නිසා පමණක් බලපෑමට ලක්වූ පුද්ගලයන් ගණන 483,173ක් පමණ වේ. එමෙන්ම ගංවතුර හේතුවෙන් පුද්ගලයන් 121,236ක් සහ දැඩිසුලං සහ සුළි සුලං තත්වයන් හේතුවෙන් පුද්ගලයන්

102,278ක් බලපෑමට ලක්ව ඇත. ඉහතින් සඳහන් කල ආපදා තත්වයන් හේතුවෙන් මරණයට පත් වූ සංඛ්‍යාව 37ක් වන අතර තුවාල සිදුවීම් 86ක් වාර්තා වී ඇත. තවද, 2018 සහ 2019 වසරවලට සාපේක්ෂව මරණ සහ තුවාල සිදුවීම් අවස්ථා සාපේක්ෂව අවම අගයක් වාර්තා වී ඇත.



සටහන 2.3: ආපදා හේතුවෙන් සිදුවූ මරණ සංඛ්‍යාව



සටහන 2.4: ආපදා හේතුවෙන් සිදුවූ මරණ හා තුවාලවීම්



සටහන 2.5: ආපදාවන්ට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව

සටහන

ආපදා හේතුවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ සංඛ්‍යා ලේඛණ ඉදිරිපත් කිරීමේදී සමුච්චිත එකතුව භාවිතා කර ඇත.

ii. නිවාස හානි - 2020

2018 සහ 2019 වසරවලට සාපේක්ෂව පූර්ණ හා අර්ධ නිවාස හානි අවස්ථා සාපේක්ෂව අවම අගයක් වාර්තා වී ඇත. ඒ අතරින් නිවාස 16,755ක් අර්ධ වශයෙන් හානි වී ඇති අතර නිවාස 307ක් පූර්ණ වශයෙන් හානි වී ඇත.



සටහන 2.6: පර්ණ හා අර්ධ නිවාස හානි අවස්ථා

2020 වර්ෂයේ දෙසැම්බර් සහ මැයි මාසයන්හි නිවාස හානි වැඩියෙන් වාර්තා වී ඇති අතර මෝසම් සුළං තත්වයන් හේතුවෙන් ඇතිවූ දැඩි සුලං සහ ගංවතුර එයට හේතු වී ඇත. එම හානි වූ නිවාස වාර්තා වන්නේ යාපනය සහ රත්නපුර දිස්ත්‍රික්කයන් වෙතිනි.



සටහන 2.7: නිවාස හානි සිදුවූ මාසයන්

2020 වසර තුළ ආපදාවන් අනුව සිදු වූ නිවාස හානි සලකා බැලීමේදී සුළි සුළං හේතුවෙන් නිවාස 2884ක් අර්ධව හානි වී ඇති අතර නිවාස 103ක් පූර්ණව හානි වී ඇත. එමෙන්ම දැඩි සුළං හේතුවෙන් නිවාස 1323ක් අර්ධව හානි වී ඇති අතර නිවාස 80ක් පූර්ණව හානි වී ඇත.



සටහන 2.8: ආපදාවන් අනුව සිදුවූ නිවාස හානි

iii. ආපදා හේතුවෙන් බලෑමට ලක්වූ දිස්ත්‍රික්කයන්

ඉහත සඳහන් කළ ආපදා තත්වයන් හේතුවෙන් නිවාස හානි සිදුවූ දිස්ත්‍රික්ක පහත පරිදි වන අතර යාපනය සහ රත්නපුර දිස්ත්‍රික්කයන් එම හානි වාර්තා වී ඇත.



සටහන 2.9: නිවාස හානි වූ දිස්ත්‍රික්ක



සටහන 2.10: ආපදාවලින් මරණයට පත්වූ පුද්ගලයින් සංඛ්‍යාව



සටහන 2.11: ආපදාවලින් බලපෑමට ලක්වූ පුද්ගලයින්



සටහන 2.12: ගංවතුර හේතුවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයින්



සටහන 2.13: නියඟය හේතුවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයින්

3. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමේ කාර්යය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවසන් කර ඇති අතර එම සංශෝධිත පනත් කෙටුම්පත නීතිපති අනුමැතිය සඳහා යොමුකර ඇත.

3.2 බහුවිධ ආපදා අවදානම අවම කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (MHEW 2020)

ආපදා අවදානම අවම කිරීම සඳහා සෙන්දායි රාමුව 2015 – 2030 ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම සඳහා පර්යේෂණ, විද්‍යාව හා තාක්ෂණය හුවමාරු කිරීම සඳහා බහුවිධ ආපදා අවදානම අවම කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදි. මෙමඟින් ආපදා අවදානම පාලනය කිරීමේදී මේ දක්වා ලබා ඇති ප්‍රගතිය පිළිඹිබු කිරීමට මෙන්ම ඉදිරියේ ඇති අභියෝග සහ අවස්ථාවන් සලකා බැලීමට ද මෙමඟින් බලාපොරොත්තු වේ. මෙම සම්මන්ත්‍රණය 2020 මාර්තු මස 16 සිට 18 දක්වා කොළඹ දී පැවැත්වීමට සැලැසුම් කර තිබූ නමුත් Covid 19 ගෝලීය වසංගතය පැතිරීම හේතුවෙන් (දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විද්වතුන් විශාල

සංඛ්‍යාවක් සහභාගීත්වයෙන්) සම්මන්ත්‍රණය කල් දැමීමට තීරණය කරන ලදි. ඒ අනුව 2020 දෙසැම්බර් 14 සිට 16 දක්වා කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී Zoom තාක්ෂණය මඟින් රටවල් 40ක සහභාගීත්වයෙන් මෙම උත්සවය පවත්වන ලදි.

<u>ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ අරමුණු</u>

- ආපදා අවම කිරීම්, තිරසාර සංවර්ධනය සහ දේශගුණික විපර්යාස පිළිබඳ ගෝලීය රාමුවලට පෙළගැස්වීම.
- ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධනය
- නවීන සංවර්ධනයන් සහ ප්‍රතිපත්ති සඳහා නිර්දේශයන් ලබාගැනීම.
- ආපදා අවදානම අවම කිරීම සඳහා සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා පර්යේෂණ, විද්‍යාව හා තාක්ෂණය ලබා ගැනීම සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා කොළඹ 2020 ආපදා අවදානම් අවම කිරීම් ප්‍රකාශය දියත් කිරීම 2015 – 2030.

<u>මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන තේමාවන්</u>

තේමාව 1 - දේශගුණික විපර්යාස සහ පූර්ව අනතුරු ඇඟවීම

තේමාව 2 - ආපදා සඳහා සූදානම් වීම

තේමාව 3 - ආපදා අවදානම අවම කිරීම සඳහා සෙන්දායි රාමුව 2015 – 2030 / තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs)

තේමාව 4 - අවදානම් මාරු කිරීම / රක්ෂණය

තේමාව 5 - නව්‍යකරණය

තේමාව 6 - වඩා හොඳ පූර්ව අනතුරු ඇඟවීම සඳහා සන්නිවේදනය

තේමාව 7 - ආපදා අවදානම් අවම කිරීම

තේමාව 8 - සෞඛ්‍ය

<u>අරමුදල් සම්පාදනය සහ දායකත්වය</u>

මෙම සම්මන්ත්‍රණය සඳහා සියලුම වියදම් ආපදා කළමනාකරණ සම්බන්ධ පාර්ශවකාර ආයතන මඟින් දැරූ අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කිසිදු වියදමක් නොදරන ලදි.

වගුව 3.1: අරමුදල් සම්පාදනය හා දායකත්වය

සංවිධානයේ නම	දායකත්වය
හඩර්ස්ෆීල්ඩ් විශ්ව විද්‍යාලය - එක්සත් රාජධානිය	බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ වියදම් (උත්සව පුවත්පත් අතිරේකය, අදාළ ද්‍රව්‍ය මුද්‍රණය)
ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය (ADPC)	ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් කළමනාකරණයේ විකාශය පිළිබඳ වීඩියෝ
ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA)	සම්මන්ත්‍රණය සිහිවටන ඇසුරුම, ඡායාරූප මුද්‍රණය

ලෝක ආහාර සංවිධානය (WFP)	චිත්‍ර තරඟය හා මාධ්‍ය සහය
ළමා අරමුදල (Child fund)	චිත්‍ර තරඟය හා අර්ධ සහය
World Vision	චිත්‍ර තරඟය හා අර්ධ සහය
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)	සිදුවීම් කළමනාකරණය

3.3 ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සමගාමීව පැවැත් වූ ජාතික මට්ටමේ චිත්‍ර තරඟය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2020 වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කරන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සමගාමීව රටේ සියලු පාසල් ආවරණය වන පරිදි ජාතික මට්ටමේ චිත්‍ර තරඟාවලියක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වී පවත්වන ලදි. මෙම චිත්‍ර තරඟය පැවැත්වීමේ දී මූලික අරමුණ වූයේ පාසල් සිසුන් මෙන්ම පාසල් ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවට ආපදා හා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳව පවතින ප්‍රායෝගික තත්වයන් හා ඒ පිළිබඳ අවබෝධය හා දැනුම මෙන්ම ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළ පාසල් සිසුන්, ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ වගකීම කවරේ ද යන්න අවබෝධ කර දීම මෙම ජාතික මට්ටමේ චිත්‍ර තරඟය පැවැත්වීමේ ප්‍රධානතම අරමුණ විය.

ජාතික මට්ටමේ පැවැත්වූ මෙම චිත්‍ර තරඟයට සිසු දරුවන්ගේ චිත්‍ර 1910ක් අතුරින් එක් කාණ්ඩයකින් චිත්‍ර 25 බැගින් චිත්‍ර නිර්මාණ 100ක් තෝරා ගන්නා ලදි. දෙවන පියවර වශයෙන් එම චිත්‍ර 100 නිර්මාණය කරන ලද සිසු සිසුවියන් බත්තරමුල්ල " අපේගම" පරිශ්‍රයට කැඳවා එහිදී විනිශ්චය මණ්ඩලය හා අධ්‍යාපන අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිසුන් විසින් චිත්‍ර නිර්මාණය කරන ලදි. එසේ විනිශ්චය මණ්ඩලය ඉදිරියේ නිර්මාණය කරන ලද චිත්‍ර 100 අතුරින් එක් කාණ්ඩයකින් 1,2,3,4,5 යන ස්ථාන වශයෙන් කාණ්ඩ 4න්ම ජයග්‍රාහක චිත්‍ර නිර්මාණ 20ක් තෝරා ගෙන ඒ අනුව ඔවුන්ට හිමි සහතිකපත්, කුසලතා, පාසල් උපකරණ ඇතුළු තෑගි ලබා දීම සිදු කරන ලදි. මෙම ජාතික මට්ටමේ චිත්‍ර තරඟයේ රන් සම්මාන 04ක් පළමු ස්ථානය වෙනුවෙන් සිසු සිසුවියන් 04 දෙනෙක් දිනා ගත් අතර රන් සම්මාන ප්‍රධානය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්තුමාගේ සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් ඉතාමත් සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ප්‍රධානය කරන ලදි.

<u>ආපදා අවදානම් අවම කිරීම පිළිබඳව පාසැල් සිසු දරු දැරියන්ගේ දැනුම සහ ආකල්ප වර්ධනය කිරීම උදෙසා සංවිධානය කරන ලද චිත්‍ර තරඟාවලිය</u>




බත්තරමුල්ල අපේගම පරිශ්‍රයට දෙවන අදියරයේ චිත්‍ර නිර්මාණය කිරීම සඳහා සහභාගී වූ සිසු දරු දැරියන් 100 දෙනා නිර්මාණය සිදුකරන ආකාරය




ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පවත්වන ලද ජයග්‍රාහක සිසු දරු දැරියන් 20 දෙනා සඳහා ත්‍යාග සහ සහතිකපත් ප්‍රධානය කිරීම.



ජාතික මට්ටමේ චිත්‍ර තරඟාවලියේ දී කාණ්ඩ 04න් පළමු, දෙවන, තෙවන, සිව්වන හා පස්වන ස්ථාන යනාදී වශයෙන් ඒ ඒ කාණ්ඩවලින් හොඳම චිත්‍ර නිර්මාණය කරන ලද සිසු සිසුවියන් 20 දෙනා සහතිකපත් ලබා ගැනීම.

3.4 ජාතික මට්ටමේ වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම

➢ **2020 ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස (උ/පෙළ) විභාගය පැවැත්වෙන කාලවලදී හදිසි ආපදාවක් වුවහොත් එයට ප්‍රතිචාර දැක්වීම සඳහා සැලැසුම් සකස් කිරීම**

2020 ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස (උ/පෙළ) විභාගය පැවැත්වෙන කාලවලදී හදිසි ආපදාවක් වුවහොත් එයට ප්‍රතිචාර දැක්වීම සඳහා සැලැසුම් සකස් කරන ලදි. ආපදා සම්බන්ධ මාර්ගෝපදේශයන් සකස් කිරීම විභාග දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශය හා අදාළ පාර්ශවවල උපදෙස් අනුව නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව විභාග පැවැත්වෙන කාලවලදී හදිසි ආපදා තත්වයක් ඇතිවුවහොත් එයට ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් සකස් කරන ලදි. මේ සඳහා මූල්‍ය දායකත්වය ආපදා කළමනාකරණය සඳහා වූ ආසියානු පැසිපික් සංවිධානය (APAD) මඟින් දරන ලදි.





➢ **2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ආපදා ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් සකස් කිරීම**

2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ආපදා ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් සකස් කරන ලදි. මැතිවරණ කොමසාරිස්තුමාගේ ඉල්ලීම පරිදි 2020 මැතිවරණය පැවැත්වෙන කාලසීමාවලදී ආපදා අවස්ථා වුවහොත් අපහසුතාවයකින් තොරව මහජනතාවට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පැය 24 පුරාම මැතිවරණ කටයුතු සාකච්ඡා කර ගැනීම සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් සකස් කරන ලදි. මේ සඳහා මූල්‍ය දායකත්වය ආපදා කළමනාකරණය සඳහා වූ ආසියානු පැසිපික් සංවිධානය (APAD) මඟින් දරන ලදි.



3.5 කොවිඩ් 19 (Covid 19) වෛරසය මැඩලීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දායකත්වය

කොවිඩ් 19 වසංගත තත්ත්වය වෙනුවෙන් සම්බන්ධීකරණ මැදිරිය ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 117 මැදිරිය ජනාධිපති කාර්යය සාධන බලකාය යටතේ 2020 මාර්තු 17 දින මහජනතාවට විවෘත කළ අතර එය අඛණ්ඩව සහ 24 පුරා ක්‍රියාත්මක වෙමින්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරීන් සහ වෛද්‍ය කණ්ඩායම්වලින් සමන්විත සංයුතියකින් 117 ඇමතුම් මැදිරිය ක්‍රියාත්මක කරන ලදී. 117 ඇමතුම් මැදිරිය හරහා කොවිඩ් වසංගතය තුළදී පහත සඳහන් සේවාවන් මහජනතාවට සපයන ලදී.

- දුරකතන ඇමතුම් 1,220,00ක් මාස තුනක කාලයක් තුළ මහජනතාවගෙන් යොමු වුන අතර එම සියළු ඇමතුම්වලට ප්‍රතිචාර දක්වමින් අදාළ සියලු පාර්ශව සම්බන්ධීකරණය සිදු කරන ලදී. නිරෝධායන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ලැබෙන ලද තොරතුරු ඇතුළත් වාර්තාවන් වෛද්‍ය අංශවලට, ශ්‍රී ලංකා පොලිසියට සහ කොවිඩ් 19 සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙතත් දෛනිකව ලබා දීම සිදු කරන ලදී.
- දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, ත්‍රිවිධ හමුදාව සහ පොලීසියට, නිරෝධායන මධ්‍යස්ථාන වෙත සහ අනෙකුත් අදාළ පාර්ශව වෙත මුඛ ආවරණ, මුව ආවරණ, ශරීර ආවරණ, අත් ආවරණ, විෂබීජ නාශක දියර, උෂ්ණත්ව මාන යනාදිය ලබා දීමට කටයුතු කරන ලදී.
- කොවිඩ් 19 වසංගත තත්ත්වය මැඩපැවැත්වීම සඳහා පිළිපැදිය යුතු කරුණු ඇතුළත් පත්‍රිකා, පෝස්ටර්ස් සහ ස්ටිකර්ස් නිර්මාණය කොට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක වෙත ලබා දී ජනතාව දැනුවත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.
- කොවිඩ් 19 වසංගත තත්ත්වය මැඩපැවැත්වීම සඳහා සමාජ මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී.

එමෙන්ම, වර්තමානයේ පවතින කොවිඩ් 19 වසංගතය නිසා මහජනතාව දැනුවත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් මත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් පෝස්ටර් 150,000 දෙමළ සහ සිංහල මාධ්‍යයෙන් මුද්‍රණය කර මහජනතාව ගැවසෙන පොදු ස්ථානවල ප්‍රදර්ශණය කිරීමට සලස්වන ලෙස දිස්ත්‍රික් කාර්යාලවලට බෙදා හැරීම සිදුකරන ලදි.



කොවිඩ්-19 වසංගත තත්ත්වය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා මුද්‍රණය කරන ලද පෝස්ටර්

4. 2020 වර්ෂයේදී තාක්ෂණික අංශවල ප්‍රගතිය

2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට ගෝලීය හා ශ්‍රී ලංකාවේ ඇති වූ කොවිඩ් - 19 වසංගත තත්වය හේතු කොට ගෙන 2020 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කල වැඩසටහන් ඒ ඒ කාල පරාසයන් තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එපමණක් නොව ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් ආපදා අවදානම් කලාප තුළ ජනතාව ඒකරාශී කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සෞඛ්‍ය අමාත්‍යාංශය ලබා දුන් උපදෙස් හා මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක කාර්යක් විය.

තත්වය එසේ වුව ද වාර්ෂිකව අප මුහුණ දෙන ගංවතුර, නායයෑම්, සුළි සුළං ආදී ආපදා තත්වයන්ට මුහුණ දීමට ද සිදු විය. මේ තත්වය හමුවේ තාක්ෂණික ආයතන විසින් ලබා දුන් පුරෝකතන අනුව 2020 වර්ෂයේ ඇති වූ සියලු ආපදා තත්වයන් කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කිරීමේ ජාතික වගකීම ඉටු කිරීමේ අභියෝගාත්මක කාර්යට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මුහුණ දීමට සිදු විය.

රට තුළ ඇති වූ මෙම අනපේක්ෂිත තත්වය හමුවේ 2020 මාර්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කොවිඩ් - 19 වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය කලින් කලට ලබා දුන් මාර්ගෝපදේශ සහ විධිවිධාන ද අනුගමනය කරමින් ඇතිවිය හැකි ආපදා කළමනාකරණය කිරීම සඳහා විවිධ උපායමාර්ග යොදා ගෙන ජනතාව දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන්, පෙර සූදානම් වැඩසටහන් හා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

කොවිඩ් 19 වසංගත තත්වයෙන් වුවද මුහුණ දීමට සිදු වූ ව්‍යසන තත්වයන්ගෙන් ජීවිත හා දේපළ විනාශය අවම කිරීමට හැකි විය.

4.1 පෙර සූදානම් හා සැලැසුම් අංශය

2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් පරිදි දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, අවදානමට ලක්ව ඇති ග්‍රාම නිළධාරී කොට්ඨාස සහ රාජ්‍ය අංශයේ ආයතන ආදිය සඳහා ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් හා සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයක් වේ. ගංවතුර, නායයෑම්, සුනාමි, සුළි සුළං ආදි ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව ඇතිවන උවදුරු සඳහා ආපදා පෙර සූදානම් කටයුතු සැලසුම් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙරසූදානම් හා සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන එක් කාර්යයක් වේ.

ආපදාවන් සිදුවන විට එයට ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට සහාය වන කෘත්‍යාත්මක ලේඛනයක් ලෙස ආපදා පෙර සූදානම් සැලැස්ම හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයන් තුළ සිදුවන ආපදා සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරීත්ව ආයතන වන්නේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවයි. කමිටුවේ සාමාජිකත්වය, අනු කමිටු සහ ඔවුන්ගේ කාර්යභාර්යයන් සහ වගකීම් මොනවාද යන්න සැලැස්ම තුළ ලේඛනගත කර ඇත.

පරිපාලන ප්‍රදේශය පිළිබඳ තොරතුරු, පවතින උවදුරු, අවදානම් තත්ත්වවල ප්‍රතිඵල සහ සිදුකරන ලද අවදානම් තත්ත්ව ඇගයීම්, ප්‍රධාන මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු, ප්‍රදේශය තුළ පවතින මානව හා භෞතික සම්පත් සහ ව්‍යසන ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ගේ වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම්වල අන්තර්ගත වේ.

4.1.1 දිස්ත්‍රික් මට්ටමේ පෙර සුදානම් සැලසුම්

2020 වර්ෂයට ලැබුණු රු.මි.5.50 යොදා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරන ලද අතර එහි මූල්‍ය ප්‍රගතිය 85%ක් ලෙසත්, භෞතික ප්‍රගතිය 83%ක් ලෙසත් වාර්තා වී ඇත.

2020 වර්ෂයේදී දිස්ත්‍රික් 25 තුළ ව්‍යසන සඳහා පෙර සූදානම් සැලසුම් කටයුතු නිර්මාණය කිරීම සහ ඒ පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා රු. මිලියන 5.50ක මුදලක් වෙන් කරන ලදී. රටෙහි ආර්ථික තත්වය සහ ව්‍යසන මඟින් ප්‍රජාවට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන මුදා හරිනු ලැබේ. දිස්ත්‍රික්ක අතර ප්‍රතිපාදන බෙදා හැරීම සිදු කරන ලද ආකාරය සහ එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

වගුව 4.1: දිස්ත්‍රික් අතර ප්‍රතිපාදන බෙදා හැරීම හා වියදම් කිරීම 2018 - 2020

වර්ෂය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත වූ මූල්‍ය ප්‍රතිපාදන (රු. මිලියන)	වියදම (රු. මිලියන)
2018	25.0	24.93
2019	18.0	16.8
2020	5.50	4.54

දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ව්‍යසන කළමනාකරණ සක්‍රීයතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලසුම් කටයුතු සඳහා 2020 වර්ෂය තුළදී පෙර සූදානම් සැලසුම් අංශය විසින් ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. ව්‍යසන කළමනාකරණ සැලසුම් මුද්‍රණය කිරීම සහ පිළියෙල කිරීම / සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම්, වැඩමුළු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිපාදන ලබා දී ඇත.

සුනාමි, ජලගැලීම් සහ නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම උවදුරු සිතියම්ගත කිරීම, අවදානම් තත්ත්ව විශ්ලේෂණය, ග්‍රාමීය මට්ටමේ ව්‍යසන කළමනාකරණ කමිටු ස්ථාපනය කිරීම වැනි ප්‍රජා මට්ටමේ ව්‍යසන ප්‍රතිචාර වැඩසටහන් පැවැත්වීම, ජලාශ වේලි බිඳී යාමට පූර්වෝපායක් ලෙස, ජලාශ වේලි පහළ බෑවුමේ ජීවත්වන ජනතාව සඳහා හදිසි අවස්ථා තත්ව සඳහා ප්‍රතිචාර දැක්වීමට ප්‍රජා සහභාගීත්වය සහිත පෙර සූදානම් සැලසුම් නිර්මාණය කිරීම හා දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා ද මෙම අංශය විසින් ප්‍රතිපාදන සලසා දෙනු ලැබේ.

4.1.2 දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය ආපදා කළමනාකරණ සැලසුම්

2020 වර්ෂයේදී බදුල්ල හා ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි දී දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලැස්ම යාවත්කාලීන කර ඇත. 2020 වර්ෂය අවසානය වන විට දිස්ත්‍රික් 23ක ආපදා කළමනාකරණ සැලසුම් සකස් කර ඇත. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ආපදාවලට බොහෝ දුරට පාත්‍ර වන ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම් 2020 වර්ෂයේ දී සකස් කරන ලදී. එමෙන්ම ග්‍රාමීය ආපදා කළමනාකරණ සැලසුම් 17ක් සකසන ලදී.

4.1.3 ආපදා පෙර සූදානම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම්

ඊසානදිග මෝසම් වර්ෂාව සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා මහනුවර, කෑගල්ල, හම්බන්තොට, කුරුණෑගල, පොළොන්නරුව, මන්නාරම, අම්පාර, යාපනය, කිළිනොච්චිය හා වවුනියාව යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්කයේ පවතින ආපදා සැලකිල්ලට ගෙන අදාළ පාර්ශව ආයතනවල සහයෝගයෙන් ආපදා අවස්ථාවල ඉතා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමට මෙම සැලසුම් සකසන ලදී. මේ සඳහා රුපියල් ලක්ෂ 389,335.00ක් වියදම් දරන ලදි.

4.1.4 අවදානම් ප්‍රදේශවල දැන්වීමේ පුවරු සවි කිරීම

නායයෑම්, ගංවතුර, සුනාමි ආපදාවලට පාත්‍රවන ප්‍රදේශවල මහජනතාව ආපදා පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෙම දැන්වීම් පුවරු සවි කරන ලදී. ලෝක ආහාර සංවිධානයේ ආධාර ඇතිව ලබා දුන් සුනාමී දැන්වීම් පුවරු 120ක් ලබා දුන් අතර ඒවා ගාල්ල, මාතර, හම්බන්තොට, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල සවිකරන ලදී. එමෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල දැන්වීම් පුවරු 67ක් 2020 වර්ෂයේ දී සවිකරන ලදී.

4.1.5 බුරවි සුළි කුණාටුව සඳහා සූදානම

2020 දෙසැම්බර් 2 සිට 4 යන දිනයන්හි සුළි කුණාටු තත්වයක් සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් අනතුරු ඇඟවීම දිවයින අවට මුහුදු ප්‍රදේශ සඳහා ප්‍රකාශයට පත් කරන ලදි. එය 2020 දෙසැම්බර් 2 වන දින සවස ශ්‍රී ලංකාවට ඊසානදිග වෙරළ තීරයෙන් මන්නාරම් බොක්කෙන් ඇතළු වී අධික සුළං හා උතුරු හා නැගෙනහිර පළාත්වල අධික වර්ෂාපතනය සහ හදිසි ගංවතුර තත්වයන් ඇති කරන ලදි. මෙහිදී අනෙකුත් පාර්ශව ආයතන සමඟ පෙර සූදානම නිසා ජීවිත හානි සිදු නොවූ අතර දේපළ හානි අවම කිරීමට ද හැකි විය.

- සුළි කුණාටුවේ කාලගුණික තත්වය සහ චලනය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ යිවර අමාත්‍යාංශයේ අන්තර්ජාල සාකච්ඡා පැවැත්වීම.
- කාලගුණික රටාවන් වෙනස් කිරීම සහ සුළි සුළඟේ චලනය පිලිබඳ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයන්හි නිරන්තර යාවත්කාලීන කිරීමේදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ සමීප සම්බන්ධීකරණයක් පැවැත්වීම.
- ප්‍රධාන පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහා කාලගුණ විද්‍යා හා වාරිමාර්ග දෙපාර්තමේන්තු සමඟ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද මාර්ගගත විශාලන රැස්වීම් පැවැත්වීම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිලධාරීන්ගේ සජීවී හා පූර්ව පටිගත කරන ලද සාකච්ඡා සමඟ මාධ්‍ය (විශේෂයෙන් රූපවාහිනිය) හරහා මහජනතාව දැනුවත් කිරීම. සුලි කුණාටුව ක්‍රියාත්මක වූ දින දෙක පුරා ජනප්‍රිය දේශීය හා පෞද්ගලික රූපවාහිනී නාලිකාවල වැඩසටහන් විකාශය විය.
- පෙර සූදානම සහ සැලැසුම් කිරීම, කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම, මහජන දැනුවත් කිරීම් සිදුකිරීම හේතුවෙන් ආපදා මට්ටම අවම විය.

4.1.6 ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන - IOWave 20

මෙම සුනාමි අනතුරු ඇඟවීම සහ හදිසි ප්‍රතිචාර ක්‍රියාපටිපාටි (SOP) සමාලෝචන කිරීම සහ හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා සූදානම් කිරීම සඳහා ඉන්දියානු සාගර රටවලට සුනාමි අනතුරු සන්නිවේදන මාර්ග පරීක්ෂා කිරීම මෙහි අරමුණ වේ. මෙම ජාතික මට්ටමේ සිට ප්‍රජා මට්ටම දක්වා පෙරහුරු වැඩසටහන් පැවැත්වීමටත් එමඟින් අනතුරු ඇඟවීමේ ක්‍රියාදාමය සියලු මට්ටම්වල සම්මත මෙහෙයුම් සන්නිවේදනයන් පරීක්ෂා කිරීමට කටයුතු කරන ලදි. ශ්‍රී ලංකාවේ ගෝලීය වසංගතය නිසා IOWave 20 පෙරහුරු වැඩසටහන මහජන සම්බන්ධයකින් තොරව රාජ්‍ය මට්ටමින් සන්නිවේදනය හා තීරණ ගැනීම සම්බන්ධව සූදානම් මට්ටම ඇගයීමට ලක් කරන ලදි. සුනාමි අනතුරට පාත්‍ර වූ වෙරළබඩ දිස්ත්‍රික්ක 14ක් ඇති අතර ඉන් කළුතර, හම්බන්තොට, අම්පාර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක 4ක් පමණක් තෝරා ගෙන පෙරහුරු වැඩසටහන් පවත්වන ලදි.



ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන - හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙම ජාතික පෙරහුරු වැඩසටහනට සම්බන්ධ පාර්ශවකරුවන්

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය
- වෙනත් පාර්ශවකරුවන් : සෞඛ්‍ය අමාත්‍යාංශය, ධීවර දෙපාර්තමේතුව, සංචාරක සංවර්ධන අධිකාරිය
- ජාතික ඇගයුම්කරුන් / නිරීක්ෂකයින්
- ජාත්‍යන්තර නිරීක්ෂකයින් : හඩර්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය

4.1.7 මෝසම් පෙර සූදානම් වැඩසටහන

ඊසාන දිග හා නිරිත දිග අන්තර් මෝසම් සමඟ ඇතිවන වර්ෂාව නිසා සිදුවන ආපදා තත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා එය බලපාන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පෙර සූදානම් සැලසුම් සකස් කරනු ලබයි. COVID 19 වසංගතය හේතුවෙන් රට තුළ පවතින තත්වය සලකා බැලීම සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රෙගුලාසිවලට අනුකූල වීම, සුදුසු සූදානම, සැලසුම් කටයුතු හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක කාර්යයකි.

දිස්ත්‍රික් මට්ටමෙන් කරන ලද පෙර සූදානම් වැඩසටහන් පහත පරිදි වේ.

- දිස්ත්‍රික් මට්ටමේ සූදානම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයන් හි දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු විසින් ඉදිරිපත් කිරීම සහ විශාලන මාර්ගගත රැස්වීම් හරහා සිදුවිම් පදනම් කරගත් ප්‍රතිචාර සැලැස්ම සකස් කිරීම. (2020 නොවැම්බර් 24 සිට 26 දක්වා)
- දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් පෙර සූදානම් රැස්වීම් 16ක් හා ප්‍රාදේශීය පෙර සුදානම් රැස්වීම් 27ක් පවත්වන ලදි.
- බලපෑමට ලක්වීය හැකි ප්‍රදේශවල සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම හා දැනුවත් කිරීම සඳහා මුද්‍රිත පත්‍රිකා බෙදා හැරීම. (එනම් සිංහල හා දෙමළ භාෂාවෙන් පිටපත් 16,000) දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක 15ක සහය ඇතිව සිදු කරන ලදි.

- UNDP විසින් අනුග්‍රහය දක්වන ලද සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සහය ඇතිව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද මෙම පත්‍රිකා නිසි සෞඛ්‍ය ක්‍රියා පටිපාටි පිළිපැදීම සහ ආපදාවල දී කඳවුරු කළමනාකරණ මාර්ගෝපදේශ අනුගමනය කිරීම.
- ඊසාන මෝසම් ප්‍රතිචාර දැක්වීම සඳහා පෙර සූදානම සැලසුම් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2020 නොවැම්බර් 13 දිනැති ආපදා කළමනාකරණ චක්‍රලේඛණය දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කරන ලදි.




දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මෝසම් පෙර සූදානම් රැස්වීම්

4.1.8 පාසල් ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආධාර ඇතිව අම්පාර, මුලතිව් හා යාපනය යන දිස්ත්‍රික්කයන්හි සුනාමි ආපදාවන්ට පාත්‍රවන පාසල් 03ක් මූලික කරගනිමින් මෙම වැඩසටහන් පවත්වන ලදි. Covid 19 වසංගතය හමුවේ සැලසුම් කරන ලද පාසල් ආපදා කළමනාකරණ සැලසුම් කිරීමට නොහැකි විය.




පාසල් ආපදා පෙර සූදානම් වැඩසටහන් - මුලතිව් දිස්ත්‍රික්කය

4.2 පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත මඟින් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව හා ඵලදායිව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම ආපදා කළමනකාරණ මධ්‍යස්ථානය වෙත පැවරි

ඇත. ඒ අනුව මහජනතාවට ආපදා හා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳවත් ඒ පිළිබඳ මහජනතාවගේ වගකීම කවරේ ද යන්න පිළිබඳවත් දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ කාර්යය හා එහි සම්බන්ධීකරණය දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ අංශය වෙත පැවරී ඇත. වර්තමානයේ වැඩිවෙමින් පවතින ආපදා අවදානම් තත්වය හා ආපදා නිසා ඇතිවන ජීවිත හා දේපල විනාශය අවම කරමින් ආපදා ප්‍රත්‍යස්ථිතික පරිසරයක් ගොඩනැගීම සඳහා ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සමඟ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ අංශය විසින් සිදු කෙරේ.

ඒ ඒ දිස්ත්‍රික්කවල පවතින ආපදා අවදානම් තත්වයන් මෙන්ම වර්තමානයේ නිර්මාණය විය හැකි ආපදා අවදානම් තත්වයන් හඳුනාගෙන එම ආපදා අවදානම් තත්වයන් කළමනාකරණය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ සියලු අංශ සම්බන්ධීකරණය කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

2020 වර්ෂයේ දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 6.8 කි. එහි මූල්‍ය ප්‍රගතිය 94% ක් දක්වා ළඟා වීමට හැකි වූ අතර භෞතික ප්‍රගතිය 100%ක් ලෙස වාර්තා වී ඇත. මෙම මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන ජාතික මට්ටමේ වැඩසටහන් මෙන්ම දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාමීය මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකි විය. විශේෂයෙන් ජනතාව ඒකරාශී කර වැඩසටහන් පැවැත්වීම සඳහා ඇති වූ බාධක හමුවේ ඒ සඳහා වූ විකල්ප ක්‍රියාමාර්ග ලෙස අත්පත්‍රිකා හා පෝස්ටර් මෙන්ම ආපදා අවස්ථාවලදී ජනතාව ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ විස්තර ඇතුළත් පොතක් ද මුද්‍රණය කර ආපදා අවදානම් කලාපවල මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරන ලදි. ඊට අමතරව දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් සෞඛ්‍ය අංශ විසින් ලබා දුන් උපදෙස් අනුගමනය කරමින් සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් සිදු කිරීමට හැකි විය. ඒ අනුව පුහුණු වැඩසටහන් සෘජු ප්‍රතිලාභීන් ලෙස 8,084ක් දෙනෙක් සහභාගී කරවා ගැනීමට හැකි වූ අතර අත් පත්‍රිකා හා පෝස්ටර් මෙන්ම පොත් ද 182,200 ප්‍රමාණයක් සිංහල, ඉංග්‍රීසි සහ දමිළ මාධ්‍යයෙන් මුද්‍රණය කර මහජනතාවට බෙදා දෙන ලදි.

4.2.1 ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

<u>“සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්තිය යටතේ ආපදා අවදානම් අවම කිරීමේ සහායකයන් පුහුණු කිරීමේ ජාතික වැඩසටහන</u>

“සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්තිය යටතේ ස්ථාපිත කිරීමට යෝජිත බහුකාර්ය සංවර්ධන කාර්යය සාධක බලකාය මඟින් අඩු ආදයම්ලාභීන්ගට රැකියා ලබාදීමේ වැඩසටහන යටතේ ආපදා අවදානම් අවම කිරීමේ සහයකයින් පුහුණු කිරීමේ කාර්යයේ දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ඒ සඳහා තාක්ෂණික සම්පත්දායකත්වය ලබාදෙන ලෙස ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් ඉල්ලා සිටින ලදි. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා හා ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ උපසභාපති ඇතුළු ආයතන දෙකේ අදාළ නිලධාරීන් ද සමඟ මෙම පුහුණු වැඩසටහන පැවැත්විය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා

කර තීරණ ගන්නා ලදි. එම තීරණවලට අනුව දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ අංශය විසින් ඒ සඳහා වූ පුහුණු මොඩියුල සිංහල සහ දමිළ භාෂාවෙන් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වෙත ලබා දෙන ලදි. මෙම පුහුණු මොඩියුල ආපදා කළමනාකරණ විෂය ධාරාව තුළ ක්‍රියාත්මක සියලු තාක්ෂණික විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි තේමාවන් තිස්දෙකක් (32) යටතේ සකස් කර දිවයිනේ සියලු දිස්ත්‍රික්කවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි.



"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්තිය යටතේ ස්ථාපිත කිරීමට යෝජිත බහුකාර්ය සංවර්ධන කාර්යය සාධක බලකාය මඟින් අඩු ආදයම්ලාභීන්ගට රැකියා ලබාදීමේ වැඩසටහන යටතේ ආපදා අවදානම් අවම කිරීමේ සහයකයින් පුහුණු කිරීම සඳහා සකස් කරන ලද පුහුණු මොඩියුලය

4.2.2 ත්‍රිවිධ හමුදා, පොලිස් නිලධාරීන් හා අනෙකුත් පාර්ශවකාර ආයතන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

හදිසි ආපදා අවස්ථාවල දී සෙවීම් හා මුදවා ගැනීමේ කාර්යයේ නිරත වන්නේ ත්‍රිවිධ හමුදාව හා පොලීසිය ඇතුළු ආරක්ෂක අංශ බැවින් ආපදා කළමනාකරණ විෂය පිළිබඳ ඔවුන් නිරන්තරයෙන් දැනුවත් කිරීම අවශ්‍ය බැවින් 2020 වර්ෂයේ තුළ ද ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම සිදු කරන ලදි.

ඊට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විද්‍යාත්මක සේවා නිලධාරීන් සඳහා වැඩසටහන් 02ක් පවත්වන ලදි. ඒ පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

වගුව 4.2: ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විද්‍යාත්මක සේවා නිලධාරීන් සඳහා වැඩසටහන්

අනු අංකය	ඉලක්කගත කණ්ඩායම / දැනුවත් කිරීමේ වැඩසටහන	සහභාගී වූ සංඛ්‍යාව
01	ශ්‍රී ලංකා යුධ හමුදා කැඩෙට් නිලධාරීන් සඳහා දැනුවත් කිරීම	30
02	ශ්‍රී ලංකා ගුවන් හමුදා ආධුනික නිලධාරීන් සඳහා දැනුවත් කිරීම	40
03	ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරීන් සඳහා දැනුවත් කිරීම	45

04	බුත්තල පුහුණු පාසලෙහි සේවාස්ත පුහුණුව ලබන ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරීන් දැනුවත් කිරීම	31
05	ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන් සඳහා දැනුවත් කිරීම	35
06	ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බලඝන පුහුණුව හදාරන නාවික සෙබළුන් සඳහා දැනුවත් කිරීම	26
08	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විද්‍යාත්මක සේවා නිලධාරීන් සඳහා දැනුවත් කිරීම	55
	එකතුව	**262**

<u>ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් හා අනෙකුත් පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන්</u>





ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන් සඳහා පවත්වන ලද ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන





ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී ශ්‍රී ලංකා යුධ හමුදා කැඩෙට් නිලධාරීන් සඳහා පවත්වන ලද ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

4.2.3 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන

ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ කොවිඩ් -19 ව්‍යසනය හේතුවෙන් 2020 වර්ෂයේ ග්‍රාමීය මට්ටමින් වැඩසටහන් සඳහා ජනතාව ඒකරාශී කිරීම අභියෝගකාරී වුව ද ආපදා තොරතුරු සන්නිවේදන ප්‍රවාහය ශක්තිමත් කරමින් කෙටි වෙලාවක් තුළ ආපදා අවදානම් තත්වයන් පිළිබඳ ජනතාව දැනුවත්

කර ඔවුන්ගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරීම අරමුණු කරගනිමින් සෞඛ්‍ය අංශ විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන 2020 වර්ෂයේ දී ක්‍රියාක්මක කරන ලදී.

ආපදා කළමනාකරණ ක්‍රියාවලිය හා සම්බන්ධව සිටින ප්‍රධාන තාක්ෂණික ආයතනවල සහයෝගය ඇතිව දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන් හට ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම, අවබෝධය හා අත්දැකීම් ලබා දෙමින් මාධ්‍යවේදීන් පුහුණු කිරීම, තම මාධ්‍ය ආයතන වෙත හදිසි අවස්ථා පිළිබඳ සත්‍ය හා නිවැරදි තොරතුරු කඩිනමින් ලබා දී ජනතාව දැනුවත් කර ජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කරමින් හදිසි ආපදා අවස්ථාවලට ප්‍රතිචාර දැක්වීමත් ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ මහජනතාවගේ අවදානය යොමු කරවීමට හැකි පරිසරයක් සකස් කිරීමත් එසේම කෙටි කාලයක් තුළ නිවැරදි සහ සරලව අදාළ තොරතුරු මාධ්‍ය මඟින් ප්‍රජාව වෙත සන්නිවේදනය කරවීමත් ඒ සඳහා ප්‍රාදේශීය මට්ටමින් සන්නිවේදන තොරතුරු හුවමාරු කරගැනීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමත් මෙම වැඩසටහනේ අරමුණ වේ.

2020 වර්ෂය තුළ පවත්වන ලද දිස්ත්‍රික් මාධ්‍යවේදී දැනුවත් කිරීමේ වැඩමුළු

වගුව 4.3: 2020 වර්ෂය තුළ පවත්වන ලද දිස්ත්‍රික් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළු

අංකය	දිස්ත්‍රික්කය	සහභාගී වූ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සංඛ්‍යාව
1	කිලිනොච්චි	50
2	මඩකලපුව	50
3	පොලොන්නරුව	35
4	වව්නියාව	52
5	අම්පාර	51
එකතුව		**238**

2020 වර්ෂය තුළ පවත්වන ලද දිස්ත්‍රික් මාධ්‍යවේදී දැනුවත් කිරීමේ වැඩමුළුවල ඡායාරූප කිහිපයක් පහත දක්වා ඇත.





දිස්ත්‍රික් මාධ්‍යවේදන් දැනුවත් කිරීමේ වැඩසටහන - මඩකලපුව, අම්පාර

<u>ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ මහජනතාවගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා අත්පත්‍රිකා පෝස්ටර් සහ පුවත්පත් දැන්වීම් නිර්මාණය කිරීම</u>

වර්තමානයේ රටේ පවතින කොවිඩ්-19 වසංගත තත්වය සමඟ මෝසම් සක්‍රිය වුවහොත් එය කළමනාකරණය කිරීම දැඩි අවදානම් ක්‍රියාවලියක් විය හැකි බැවින් ද කොවිඩ් -19 වසංගත තත්වය මත සෞඛ්‍ය අංශ ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව ඇතිවිය හැකි ආපදා අවදානම අවම කර ගැනීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා ග්‍රාමීය මට්ටමින් ජනතාව ඒකරාශී කිරීම අපහසු වූ බැවින් ද පවතින ආපදා අවදානම් තත්වය කළමනාකරණය සඳහා මහජනතාවගේ දායකත්වය ලබා ගැනීම අත්‍යවශ්‍ය බැවින් ද ජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා, පෝස්ටර් මෙන්ම පොත් මුද්‍රණය කර සියලු දිස්ත්‍රික්ක වෙත බෙදා හැරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදී.

2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට මුහුණ දුන් කොවිඩ් -19 තත්වය හමුවේ ඇති විය හැකි ආපදා කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා විවිධ උපායමාර්ග අනුගමනය කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සිදු විය. ඒ අනුව සුවිශේෂී වගකීමක් වූයේ මෝසම් වර්ෂා කාලය තුළ ඇති විය හැකි නාය යෑම්, ගංවතුර හදිසි ආපදා තත්වයන්ගෙන් ජන ජීවිතය සුරක්ෂිත කිරීමයි. නමුත් පෙර වසර මෙන් ජනතාව ඒකරාශී කිරීමට අපහසු වූ බැවින් ජාතික පුවත්පත් හරහා අවශ්‍ය තොරතුරු ලබා දෙමින් මහජනතාව දැනුවත් කිරීමට පියවර ගන්නා ලදි.

<u>2020 ජනවාරි මස සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මුද්‍රණය කර බෙදා හරින ලද පෝස්ටර්, දැනුවත් කිරීමේ පොත්</u>



සුරක්ෂිත ප්‍රජාවක් සඳහා මෝසම් වර්ෂාව නිසා ඇතිවිය හැකි ආපදා පෙරසූදානම් හා ප්‍රතිචාර දැක්වීමේ මාර්ගෝපදේශ සහිත පොත් පිංච





සුරක්ෂිත ප්‍රජාවක් සඳහා ඊසානදිග මෝසම් වර්ෂාව නිසා ඇතිවිය හැකි ආපදා පෙරසූදානම් හා ප්‍රතිචාර දැක්වීමේ මාර්ගෝපදේශ සහිත පෝස්ටරය

මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම

පවතින හදිසි ආපදා තත්වයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අදාළ තාක්ෂණික ආයතන ද ඒකාබද්ධව මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව 2020 වර්ෂයේ නිරිත දිග මෝසම් වර්ෂාව හේතුවෙන් ඇති විය හැකි ආපදා තත්වය පිළිබඳව කල්වේලා ඇතිව මහජනතාවට තොරතුරු දැනුවත් කිරීමට ජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය හමු මඟින් සිදු කෙරේ. ආපදා පෙර සුදානම් කටයුතු ශක්තිමත් කිරීම, ආපදා අවස්ථාවල දී මාධ්‍ය මඟින් නිවැරදි දත්ත සහ තොරතුරු මහජනතාව වෙත ලබාදීම, මෝසම් සක්‍රීයවීමත් සමග ඇති විය හැකි ආපදා අවදානම අවම කරගනිමින් මහජනතාව කටයුතු කළ යුතු ආකාරය මෙමඟින් සිදු කෙරේ. මේ සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතන සියල්ලම සම්බන්ධීකරණය කිරීම සිදු කෙරේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල යාවත්කාලීන කිරීම

ආපදා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම සහ මහජනතාව ඒ පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම වෙනත් වැදගත් තොරතුරු ප්‍රසිද්ධ කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළ වෙබ් අඩවි හරහා සිදු කෙරේ. මීට අමතරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පවත්වා ගෙන යනු ලබන සමාජ මාධ්‍ය ජාල ද යාවත්කාලීන කරමින් හදිසි ආපදා තත්වයන් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට සමාජ මාධ්‍ය හරහා පියවර ගන්නා ලදි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පහත සඳහන් වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ජාල මහජනතාවට තොරතුරු ලබා දීම සඳහා පරිහරණය කරනු ලබයි



ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිල වෙබ් අඩවිය



ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන මුහුණු පොත (Facebook Page)



ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ට්විටර් පිටුව (Twitter Page)

4.2.4 දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් වැඩසටහන්

රටේ ආපදා කළමනාකරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඒ ඒ දිස්ත්‍රික්කවල පවතින ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දිස්ත්‍රික් කාර්යාල වෙත පවරා ඇත. ඒ අනුව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක විසින් දිස්ත්‍රික් මට්ටමේ සියලු වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

2020 වර්ෂයේ මුහුණ පෑමට සිදු වූ අභියෝග හමුවේ වුව ද දිස්ත්‍රික් කාර්ය මණ්ඩල ඒ ඒ දිස්ත්‍රික්ක තුළ පවතින ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන් හුදෙක්ම සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට සිදු විය. දිස්ත්‍රික් 25 තුළ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ලක්ෂ 40ක මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන වැඩසටහන් 100කට ආසන්න සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදි. එහිදී සෘජු ප්‍රතිලාභීන් ලෙස වැඩසටහන්වලට සහභාගී වූ සංඛ්‍යාව 7,046 දෙනෙකි.

දිස්ත්‍රික් අනුව මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම - 2020



සටහන 4.1: දිස්ත්‍රික් අනුව ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන



ගොවි සංවිධාන නිලධාරීන් සඳහා පැවති ප්‍රථමාධාර පුහුණු වැඩසටහන -තමන්කඩුව ප්‍රා.ලේ. කොට්ඨාශය



පොලිස් නිලධාරීන් සඳහා පැවති ප්‍රථමාධාර පුහුණු වැඩසටහන- පොලොන්නරු දිස්ත්‍රික්කය



රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන
යාපනය දිස්ත්‍රික්කය



පාසල් ප්‍රජාව සඳහා පැවති ගිනි ආරක්ෂණ වැඩසටහන
යාපනය දිස්ත්‍රික්කය



කඳවුරු කළමනාකරණ පුහුණු වැඩසටහන ත්‍රිකුණාමලය
. දිස්ත්‍රික්කය



ජීවිතාරක්ෂණ පුහුණු වැඩසටහන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය



ව්‍යාපාර ප්‍රජාව සඳහා පැවති ගිනි ආරක්ෂණ වැඩසටහන
කෑගල්ල දිස්ත්‍රික්කය



රාජ්‍ය නිලධාරීන් සහ ග්‍රාමීය ප්‍රජාව සඳහා බෝට්ටු හැසිරවීම
පිළිබඳ පුහුණු වැඩසටහන ගාල්ල දිස්ත්‍රික්කය

4.2.5 ජාතික සුරක්ෂිත දින වැඩසටහන

2004 වර්ෂයේ සුනාමි ව්‍යසනය හමුවේ 35,000කට වැඩි පිරිසකගේ ජීවිත අහිමි වූ අතර බිලියන ගණනක් වටිනා දේපල අහිමි විය. ඒ අනුව සුනාමි ව්‍යසනය ඇතුළු එදා මෙදා තුර ව්‍යසනවලින් මියගිය ජනතාව සිහිපත් කිරීම සඳහා 2005 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව සෑම වසරකම දෙසැම්බර් 26 වන දින සුනාමියෙන් හා අනෙකුත් ආපදාවලින් මියගිය ජනතාව සිහිපත් කිරීම සඳහා සර්ව ආගමික වැඩසටහන්වලට මූලිකත්වය දී ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ ඇති වැදගත්කම මෙන්ම ඒ සඳහා මහජනතාවගේ දායකත්වය පිළිබඳවත් දැනුවත් කිරීම මෙහි ප්‍රධානතම අරමුණ විය.

ඒ අනුව 2005 වර්ෂයේ සිට මේ දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 26 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ජාතික සුරක්ෂිත දින තේමා අරමුණ අනුව දිවයින පුරා වැඩසටහන් සිදු කරන ලදි.

2020 වර්ෂයේ පැවති අභියෝග හමුවේ වුව ද සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් 25 තුළ මෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ද සුනාමී ව්‍යසන ඇතුළු හදිසි ආපදාවලින් මියගිය ජනතාව සිහිපත් කරමින් ඒ අයට පිං පැමිණෙවීම පිළිබඳව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. 2020 වර්ෂයේ ජාතික සුරක්ෂිත දින ක්‍රියාත්මක කළ වැඩසටහන් පිළිබඳ ඡායාරූප පහත දක්වා ඇත.




ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලය මගින් කොල්ලුපිටිය මල්ලිකා වැඩිහිටි නිවාසයේ නිවැසියන් හට දානමය කටයුතු සිදු කිරීම



යාපනය දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේදී සිදු කරන ලද ජාතික සුරක්ෂිත දින සැමරුම



රත්නපුර දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේ දී සිදු කරන ලද ජාතික සුරක්ෂිත දින සැමරුම




දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයන්හී කළමනාකරණ සහකාර නිලධාරීන් සහ ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය මගින් පවත්වනු ලැබූ ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන

4.2.6 කාර්යය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන්

කලාපයේ අනෙකුත් රටවල මෙන් ලංකාවේ ද ආපදා අවදානම් තීව්‍රතාව වැඩිවෙමින් පවතින තත්ත්වය නිසා සිදුවිය හැකි ජීවිත හා දේපල හානිය මෙන්ම එහි අනෙකුත් බලපෑම් ද වැඩිවෙමින් පවති. වර්තමානයේ පවතින ආපදා අවදානම් මෙන්ම අනාගතයේ නිර්මාණය විය හැකි ආපදා අවදානම් තත්ත්වයන් කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපල

සුරක්ෂිත කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියලු නිලධාරීන් හට නවීන තාක්ෂණික දැනුමින් යුත් කුසලතා වර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වාර්ෂිකව කාර්යය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

2020 වර්ෂයේ ධාරිතා වර්ධන වැඩසටහන යටතේ 2020 ජනවාරි සිට අගෝස්තු 31 දක්වා රුපියල් ලක්ෂ 10ක මූල්‍ය ප්‍රතිපාදන ලැබුණු අතර එම මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රමුඛ අවශ්‍යතා තෝරා ගෙන ධාරිතා වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඊට අමතරව ලෝක ආහාර වැඩසටහනේ මූල්‍ය දායකත්වයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිළධාරීන්, ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ නිළධාරීන් ද ඇතුළුව නිළධාරීන් 31 දෙනෙකුට ධාරිතා වර්ධනය සඳහා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනයේදී පවත්වන ලදි. එමෙන්ම, ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන කාර්යමණ්ඩලයේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීම සඳහා ලෝක ආහාර වැඩසටහනේ මූල්‍ය දායකත්වයෙන් බ්‍රිතාන්‍ය කවුන්සලයේ “British Council” සම්පත් දායකත්වයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිළධාරීන් 25 දෙනෙකු සඳහා සහතිකපත්‍ර පාඨමාලාවක් පවත්වන ලදි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධන වැඩසටහනේ විස්තර පහත සඳහන් වේ.

වගුව 4.4: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධන වැඩසටහන්

අංකය	වැඩසටහන	සහභාගී වූ ප්‍රමාණය
01	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අනුයුක්ත නවක ත්‍රිවිධ හමුදා නිලධාරීන් සඳහා හඳුන්වාදීමේ වැඩසටහන	10
02	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දින 02 ක පුහුණු වැඩසටහන	35
03	විගණන විමසුම් අවම කර ගැනීම පිළිබඳ දින 02ක පුහුණු වැඩසටහන	25
04	කාර්යක්ෂමතා කඩඉම් විභාගය	
05	කැළණිය විශ්වවිද්‍යාලය මඟින් මෙහෙය වන ආපදා අවදානම් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම	02
06	117 ඇමතුම් මැදිරියේ කාර්යය මණ්ඩලය සඳහා සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම පිළිබඳ දින 10 ක පුහුණු පාඨමාලාව	13
07	බ්‍රිතාන්‍ය කවුන්සලය මගින් පවත්වනු ලැබූ ඉංග්‍රීසි පාඨමාලාව	25
08	ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය මඟින් පවත්වනු ලැබූ ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	31
එකතුව		**141**



කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා පවත්වන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන



බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සම්පත්දායකත්වයෙන් පවත්වන ලද ඉංග්‍රීසි පාඨමාලාව





ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන අධ්‍යක්ෂකවරු සහකාර අධ්‍යක්ෂවරු සඳහා පවත්වනු ලැබූ විගණන විමසුම් අවම කර ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන

4.3 අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

දිස්ත්‍රික් 25 තුළ ස්ථාපනය කර ඇති දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන මඟින් ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් දියත්කිරීම සහ සම්බන්ධීකරණය සිදුකරනු ලබන අතර ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් පහත සඳහන් කාර්යභාරය ඉටුකරනු ලබයි.

මහා භාණ්ඩාගාරය මඟින් පහත සඳහන් පරිදි 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය වෙත කාර්තුමය වශයෙන් වෙන්කරන ලද අතර එම වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානය දක්වා භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ද පහත පරිදි වේ.

2020 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන සහ මූල්‍ය හා භෞතික ප්‍රගති සාරාංශය.

වගුව 4.5: 2020 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

වැය ශීර්ෂය	ව්‍යාපෘතිය	2020 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
			රුපියල් මිලියන	(%)	
3-2509	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	85.12	67.53	80%	100%
10-2509	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම	1	0.88	88%	70%

4.3.1 අංශය මඟින් සිදුකරනු ලබන වෙනත් ක්‍රියාකාරකම්

➢ **Desinventra දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම**

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත ගබඩාව www.desinventra.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇත. මෙම දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන වන අතර නව දත්ත මූලාශ්‍රයන් හඳුනාගනිමින් වඩාත් නිවැරදි දත්ත පද්ධතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ පිළිබඳ දිස්ත්‍රික් නිලධාරීන් පුහුණු කිරීම සිදුකරන ලදී.

➢ **riskinfo අවදානම් තොරතුරු වෙබ්අඩවිය (riskinfo web potal)**

භූ විද්‍යාත්මක දත්ත (Geospatial Data) මෙම වෙබ්අඩවියට ඇතුළත් කිරීම (upload) මෙහිදී සිදුකරනු ලබයි. මෙම භූ විද්‍යාත්මක දත්ත දෙස් විදෙස් පර්යේෂකයින් විසින් භාවිත කරනු ලබන අතර එමඟින් ආපදා සිදුවන, සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ අධ්‍යනය කිරීම්, තීරණගැනීම් ඉදිරි සැලසුම් සැකසීම් සිදුකරනු ලබයි. මේ පිලිබඳ දිස්ත්‍රික් නිලධාරීන් පුහුණු කිරීම සිදුකරන ලදී.

➢ **චන්ද්‍රිකා ඡායාරූප භාවිත කර ආපදාවට පාත්‍රවූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම**

ආපදා තත්ත්වයන්හි දී ආපදාවට පෙර සහ පසු චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීම, ‘‘ඉන්ටනැෂනල් චාටර්’’ (International Charter) ආයතනය සහ ‘‘සෙන්ටිනල් එශියා’’ (Sentinel Asia) ආයතනය මඟින් ලබාගැනීමට පහසුකම් පවතින අතර 2020 වර්ෂය අවසානයේ ඇතිවූ සුළි කුණාටු තත්වය පාදක කර ගනිමින් චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීමට කටයුතු කරන ලද අතර අදාළ සිතියම් නිර්මාණය ද සිදුකරන ලදී.

➢ **දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම**

ආපදා අවම කිරීමට අදාළව මහජනතාව විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමුකරනු ලබන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබන අතර යොමුකර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම තීරණය වනු ඇත.
2020 වර්ෂය තුළ මෙවැනි ලිපි 287ක් ලැබී ඇති අතර ඒ සියලුම ලිපි සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

4.3.2 2020 වර්ෂයේ ප්‍රගතිය

පසුගිය වසරවල සිදු වූ ආපදා සහ ඉදිරියේදී තීව්‍ර විය හැකි ආපදා පිළිබඳ අධ්‍යනය කරමින් දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා පදනම් කර ගනිමින්, අවමකිරීම් පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක සැලසුම් සකසනු ලබයි. එමෙන්ම ආපදා කළමනාකරණ විෂයට අදාළ පර්යේෂණ කටයුතු, ආපදා අවදානම් තක්සේරුව සහ සංවර්ධන ප්‍රවාහය තුළ ආපදා අවදානම් අවමකිරීම අන්තර්ග්‍රහණය කිරීම සඳහා වන කටයුතු ද අදාළ තාක්ෂණික කමිටු හරහා සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලැබේ.

මහා භාණ්ඩාගාරය මඟින් පහත සඳහන් පරිදි 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය වෙත වෙන්කරන ලදී.

අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ආපදා හඳුනාගැනීම සහ දිස්ත්‍රික් මට්ටමේ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම, ආපදා කළමනාකරණ කටයුතු සඳහා පර්යේෂණ දායකත්වය ලබාදීම සහ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම යන වැඩසටහන් සඳහා ප්‍රමුඛස්ථානය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වගකීම් සහ කාර්යභාරය ඉටුකිරීමට දායකත්වය ලබාදෙනු ලැබේ.

4.3.3 ආපදා අවමකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව තුළ ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රධානතම කාර්යයක් වන අතර එහිදී එක් එක් වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය මඟින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන කළමනාකරණය කරමින් ආපදා අවමකිරීමේ ව්‍යාපෘති යෝජනාවල ප්‍රමුඛතා ගතකිරීම අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මෙහිදී විවිධ වූ ආපදා අවම කිරීමේ වැඩසටහන් ඊට අදාළ රේඛීය අමාත්‍යාංශය මඟින් එම අමාත්‍යාංශ සතු ප්‍රතිපාදන මඟින් සිදුකරගැනීම සඳහා යොමුකෙරෙන අතර ප්‍රමුඛතාවය මත අනකුත් ආපදා අවම කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබයි.

මෙහිදී දිස්ත්‍රික් මට්ටමින් කැඳවනු ලබන ආපදා අවමකිරීමේ ව්‍යාපෘති යෝජනා සලකා බලමින් ජාතික මට්ටමින් පත්කරනු ලබන කමිටුවක් මඟින් ආපදා අවමකිරීමේ ව්‍යාපෘති තෝරාගනු ලබන අතර ඉන් අනතුරුව එම ව්‍යාපෘති යෝජනාවලට අදාළ විස්තරාත්මක තක්සේරු වාර්තා සහ අදාළ වන අනෙකුත් තාක්ෂණික වාර්තා ද සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික් ලේකම්වරු වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා සිදුකරනු ලැබේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලබන අතර ජාතික මට්ටමින් ද ව්‍යාපෘති ප්‍රගතිය අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි. එක් එක් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන විවිධ වූ තාක්ෂණික දායකත්වයන් දිස්ත්‍රික් මට්ටමින් ඊට අදාළ තාක්ෂණික ආයතන මඟින් ලබාගනු ලබන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මූල්‍ය සංසරණය සිදුකරනු ලබයි. ව්‍යාපෘතිය නිමකිරීමෙන් අනතුරුව විධිමත් ක්ෂේත්‍ර පරීක්ෂණයකින් අනතුරුව ව්‍යාපෘතිය සාර්ථකව නිමකල බවට අදාළ තාක්ෂණික නිර්දේශයන් සමඟ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක මඟින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත වාර්තා කරනු ලැබේ.

ආපදා පිළිබඳ තොරතුරු සහ දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කරන ලද යෝජනා පදනම්කර ගනිමින් ඉදිරිපත් කරන ලද අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 85.12ක් 2020 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය මඟින් අනුමත කොට ඇත. (රු.මිලියන 25.12ක්, රු.මිලියන 30ක් සහ රු. මිලියන 30ක් ලෙස අවස්ථා තුනකදී මහා භාණ්ඩාගාරය මඟින් වෙන්කරන ලදී).

2019 වර්ෂයේ බිල්පත් ගෙවීම සඳහා අක්මුදල් නොමැති වීම හේතුවෙන් එම බිල්පත් පියවීම 2020 වර්ෂයේ ප්‍රතිපාදන මඟින් සිදුකිරීමට සිදුවිය. ඒ අනුව 2020 වසර සඳහා වෙන්වන ලද ප්‍රතිපාදන මඟින්

රු. මිලියන 31.34ක මුදලක්, 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල හිඟ බිල්පත් ගෙවීම සඳහා ව්‍යාපෘති අවසන් කිරීම සඳහා ලබාදෙන ලදී. ඉන් අනතුරුව 2020 වර්ෂයේ දිස්ත්‍රික්ක 10ක නව ව්‍යාපෘති 31ක් සඳහා අතිරික්ත ප්‍රතිපාදන, ප්‍රතිපාදන ලැබුණු පිළිවෙල අනුව වෙන්කරන ලදී.

4.3.4 නව ව්‍යාපෘති

වගුව 4.6: අංශය මඟින් සිදුකරන ලද නව ව්‍යාපෘති

අනු.අංකය	දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන	ප්‍රතිපාදන (රු. මිලියන)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	භෞතික ප්‍රගතිය %
1	යාපනය	2	1.15	1.11	100
2	කොළඹ	1	0.04	0.04	100
3	බදුල්ල	2	6.71	5.14	100
4	මාතලේ	2	5.77	5.49	100
5	කිලිනොච්චි	1	4.00	3.09	100
6	නුවරඑලිය	3	3.34	3.25	100
7	රත්නපුර	2	3.44	3.44	100
8	කෑගල්ල	10	8.76	8.89	100
9	මහනුවර	7	6.34	5.79	100
10	මොනරාගල	1	0.73	7.28	100

4.3.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවස්ථා



මාතලේ- විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නියඟය මඟින් සිදුවන හානිය අවම කිරීම සඳහා ගොවි ලිං (වගා ලිං) ඉදිකිරීමේ ව්‍යාපෘතිය



යාපනය- සරසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිය

4.3.6 ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම

ආපදා කළමනාකරණ විෂය සාමූහික ක්‍රියාදාමයක් වියයුතු අතර මේ සඳහා සියලු ක්ෂේත්‍රයන්හි දායකත්වය අත්‍යවශ්‍ය කාරණයක් වේ. ස්වාභාවික සහ මිනිසා විසින් ඇතිකරනු ලබන ආපදා රටේ ඕනෑම ස්ථානයක සිදුවීමේ අවදානම පවතින බැවින් ජලය, ගොඩබිම සහ ගුවන යන සෑම ක්ෂේත්‍රයකම ක්‍රියාකාරකම් සමඟ ආපදා අවදානම් අවම කිරීම බද්ධ විය යුතුව ඇත. ප්‍රායෝගිකත්වය සලකා බලමින් සෘජුවම ආපදා අවදානම් කළමනාකරණය සඳහා දායක කරගතයුතු ක්ෂේත්‍ර හඳුනාගෙන එම ක්ෂේත්‍ර තුළ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

2019 වසර තුළදී ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා මාර්ගෝපදේශය සැකසීම සිදුකරන ලදී.

01. ජාතික සැලසුම් සම්පාදන
02. නාගරික සංවර්ධන
03. ජාතික සහ පලාත් මහාමාර්ග ඉදිකිරීම් හා සංවර්ධන
04. පළාත්පාලන
05. සංචාරක
06. පුද්ගලික අංශය
07. සෞඛ්‍ය
08. ජල හා සනීපාරක්ෂාව
09. පාරිසරික බලපෑම් අධ්‍යන
10. දේශීය ආපදා කළමනාකරණ ක්‍රමෝපාය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් මෙම මාර්ගෝපදේශ මුද්‍රණය කර අදාළ ක්ෂේත්‍රවලට ලබාදීමට අපේක්ෂිත අතර එම මාර්ගෝපදේශ එක් එක් ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක කිරීම පහසුකරණය කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයන්ගේ මූලිකත්වයෙන් එම ක්ෂේත්‍රවලට අදාළ ආයතන තුළ ආපදා අවදානම් කළමනාකරණය අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ කමිටු සකස්කර, එමඟින් උක්ත මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දු කිරීමටත් මෙම වැඩසටහන පසුගමනීය කටයුතු සිදුකිරීමටත් අපේක්ෂා කෙරේ.

<u>අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට ආපදා අවදානම් අවමකිරීම අන්තර්ග්‍රහණය කිරීම</u>

ආපදා අවදානම් අවම කිරීම සමාජගත කිරීම සඳහා සුදුසුම මාධ්‍ය ලෙස පාසල් පද්ධතිය හඳුන්වා දිය හැකි අතර කුඩාකල සිට ආපදා අවදානම් කළමනාකරණය ළදරු මනස තුළ රෝපණය කිරීම තුළින් ආපදා අවදානම් අවමකිරීමේ චර්යාත්මක වෙනසක් මිනිස් සමාජය තුළ ස්ථාපනය කිරීමේ අවස්ථාව ඇත.

ආපදා අවදානම් අවමකිරීම ජීවිතයට පුරුද්දක් ලෙස එකතුවීම තුළින් රටේ සමස්ත ක්ෂේත්‍රයන් තුළ ආපදා අවදානම් අවම කිරීම ක්‍රියාත්මක කිරීම පහසුවනු ඇත. විවිධ ක්ෂේත්‍රයන් තුළ ආපදා අවදානම් අවම කිරීම අන්තර්ග්‍රහණය කිරීම සඳහා කටයුතු සිදුකෙරෙන අතරතුර උක්ත වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම තුළින් තිරසර ආපදා අවදානම් අවමකිරීමේ සංස්කෘතියක් නිරිමාණය කිරීම මෙහි දිගුකාලීන ඉලක්කය වනු ඇත.

ඒ අනුව පාසල් දරුවන් සඳහා මූලික ආපදා කළමනාකරණ මූලධර්ම පිළිබඳ දැනුවත් වෙමින් ආපදා අවදානම් තක්සේරුකරණය පාසල් මට්ටමින් සිදුකිරීම සඳහා අත්පොතක් නිර්මාණය කිරීම 2019 වසර තුළදී සිදුකරන ලද අතර මේ සඳහා විවිධ තාක්ෂණික මූලාශ්‍ර භාවිතා කර අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ සහභාගීත්වය සහිතව සිදුකරන ලදී. මෙම අත්පොත දිවයිනේ සියලුම පාසල් ආවරණය වන පරිදි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා බෙදාහැරීම 2020 වර්ෂය ආරම්භයත් සමඟ අවසන් කරන ලදී.

මෙම පොත සිංහල සහ දමිළ මාධ්‍යයෙන් මුද්‍රණය කල අතර ඉංග්‍රීසි මාධ්‍යට පරිවර්තනය කිරීම 2020 වසර තුළ සිදුකරන ලදී.

4.3.7 ආපදා අවදානම් තක්සේරුව

රට තුළ සිදුවී ඇති ආපදා, කාලගුණ සහ දේශගුණික රටා, භූවිෂමතා, ආර්ථික සමාජීය සහ භෞතික පසුබිම, ආදී විවිධ වූ කරුණු පදනම් කරගනිමින් ආපදා අවදානම් තත්වයන් පිළිබඳ යම් පුරෝකතනයක් විද්‍යාත්මකව සිදුකිරීමේ හැකියාවක් පවතින අතර මේ සඳහා විවිධ වූ තාක්ෂණික ආයතන මඟින් සිදුකරනු ලබන පරීක්ෂණ, වාර්තා ආදිය ද ඉවහල් වේ. එමෙන්ම ආපදා තත්වයක් ඇතිවුව හොත් එක් එක් ආපදා ව අනුව ගොදුරුවිය හැකි ප්‍රදේශ, ආරක්ෂිත ස්ථාන ආදී විවිධ වූ තොරතුරු විධිමත්ව නවීන තාක්ෂණය භාවිතා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සිදුකරනු ලබන

නිලධාරීන්ට පරිශීලනය කළහැකි පරිදි සැකසීම ද ඉතාමත් වැදගත් කාරණයක් වේ. එමෙන්ම ආපදා අවදානම් තක්සේරුවට අදාළ තොරතුරු මඟින් ආපදා කළමනාකරණයට අදාළ විවිධ වූ තීරණවලට එලඹීම සහ වැඩසටහන් සැලසුම් කිරීම ද පහසුකරවනු ලැබේ.

2019 වර්ෂය අවසන් වන විට අවසන් කරන ලද ආපදා අවදානම් දර්ශකය මුද්‍රණය කර අදාළ ආයතන වෙත බෙදාහැරීම සහ දැනුවත් කිරීම් සිදුකිරීම 2020 වර්ෂය තුළ සිදුකිරීමට කටයුතු කරන ලදී. මෙම අවදානම් දර්ශකය වසරින් වසර යාවත්කාලීන කරමින් අවදානම් දර්ශකයේ විචලනයන් අධ්‍යන කලයුතු වන අතර ඒ සඳහා වන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

තෝරාගත් නගර 10ක් තුළ (ගම්පහ, මීගමුව, මන්නාරම, කළුතර, කඩුවෙල, කොලොන්නාව, මොරටුව, වැල්වැටිතුරෙයි, පේදුරුතුඩුව සහ චාවකච්චේරි) ආපදා අවදානම් තක්සේරුකරණය සඳහා බිම් මට්ටමේ දත්ත ඒකරාශී කිරීම අවසන් කර ඇති අතර නගර 09කට අදාළ දත්ත පරිගණකගත කිරීම ද අවසන් කර ඇත. මීට අදාළ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින අතර ගම්පහ දිස්ත්‍රික්කයට අදාළ කටයුතු අවසන්කර ඇත.

<u>දත්ත සහ තොරතුරු කළමනාකරණය පිලිබඳවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් යාවත්කාලීන කරනු ලබන දත්ත පද්ධති පිලිබඳවත් දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීම</u>

ආපදා කළමනාකරණ විෂය පිළිබඳ සැලකීමේ දී දත්ත සහ තොරතුරු සඳහා විශේෂ ස්ථානයක් හිමි වේ. මෙහි දී දත්ත පදනම්ව තීන්දු තීරණ ගැනීම ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සියලුම ස්ථරයන්හි සිදුවන අතර විශේෂිත වූ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පළාත් සහ ජාතික මට්ටමේ වගකිව යුතු ආයතන මඟින් සිදුකිරීමේදී ද දත්ත සහ තොරතුරු දැඩි බලපෑමක් සිදුකරනු ලබයි.

උක්ත සියලුම ප්‍රතිපත්තිමය මෙන්ම අනෙකුත් තීන්දු තීරණ සඳහා වන දත්ත වැඩි ප්‍රතිශතයක් ලබාදෙනු ලබනුයේ ග්‍රාමීය, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් යාන්ත්‍රණය තුළින් වන අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රජාවට සමීපතම ස්ථරය වන දිස්ත්‍රික් යාන්ත්‍රණය මෙහි දී සුවිශේෂී ස්ථානයක් ගනී.

ඒ අනුව දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් විසින්, අවශ්‍ය දත්ත ප්‍රමුඛතාවය අනුව හඳුනාගෙන තිබීමත් එම දත්ත නිසි කලට ඒකරාශී කරගැනීම සඳහා වැඩපිළිවලක් නිර්මාණය කර තිබීමත්, දත්ත යාවත්කාලීන කිරීම සඳහා වැඩපිළිවලක් නිර්මාණය කර තිබීමත්, දත්ත ගබඩාකර තැබීම ඇතුළු දත්ත කළමනාකරණය සඳහා වන සියලු අංශයන් පිළිබඳ මනා දැනුමකින් යුතු වීමත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් යාවත්කාලීන කරනු ලබන දත්ත පද්ධතීන් භාවිතය තුළින් දිස්ත්‍රික් මට්ටමේ ආපදා අවදානම් අවම කිරීමේ කටයුතු සැලසුම් කිරීමත්, අත්‍යවශ්‍ය කරුණකි.

ඒ අනුව මේ වන විට සියලුම දිස්ත්‍රික්කවලට දත්ත පද්ධති පවත්වාගන යාම සඳහා අවශ්‍ය පරිගණක සහ GPS ලබාගැනීමේ උපකරණ ලබා දී ඇත. උක්ත පරිගණක GIS මෘදුකාංගය භාවිතාකළ හැකි ඉහළ ධාරිතාවයෙන් යුත් පරිගණක වන බැවින් දත්ත පිළිබඳ දිස්ත්‍රික් මට්ටමේ කටයුතු සිදුකිරීම සඳහා තාක්ෂණික උපකරණ මූලික මට්ටමින් සපුරා දී ඇත.

මෙම උපකරණ භාවිතය පිළිබඳ මූලික දැනුවත් කිරීමක් ද දිස්ත්‍රික් නිලධාරීන් සඳහා සිදුකර ඇති අතර දත්ත කළමනාකරණය පිළිබඳ දින හතරක පුහුණුවක් සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි නිලධාරීන් 70 දෙනෙකු සඳහා 2020 වසර තුළ සිදුකරන ලදී.

<u>අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආපදා අවදානම් තක්සේරුකරණය සිදුකිරීම</u>

ජාතික මට්ටමින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පාසල් ආපදා අවදානම් තක්සේරුවක් සිදුකිරීමේ අවශ්‍යතාවය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින්ම අවස්ථා ගණනාවකදීම ඉස්මතුවූ අතර එය කාලීන අවශ්‍යතාවයක් ද විය. ඒ අනුව 2019 වර්ෂය අග භාගයේ දී ශ්‍රී ලංකාව තුළ පාසල් සඳහා අවදානම් දර්ශකයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මූලික මැදිහත්වීම් සිදුකිරීමට මෙම අංශය කටයුතු කරන ලදී.

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡා සිදුකිරීමෙන් අනතුරුව අධ්‍යාපන කලාප අධ්‍යක්ෂකවරුන් සහ විදුහල්පතිවරුන් දැනුවත් කර උක්ත අවදානම් දර්ශකය සැකසීම සඳහා දත්ත ඒකරාශී කිරීමට අදාළ පෝරම බෙදාහැරීම සිදු කර අවසන් කර ඇති අතර එම දත්ත එකතු කිරීම මේ වන විට සිදුකෙරෙමින් පවතී. මෙම දත්ත ඒකරාශී කිරීම අතරතුර එම දත්ත පරිගණකගත කිරීම ද සිදුකෙරෙමින් පවතී. ඒ අනුව දිවයිනේ පාසල් 7137ක ප්‍රශ්නාවලි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලැබී ඇති අතර එයින් ප්‍රශ්නාවලි 1300ක දත්ත, අදාළ දත්ත ගොනුව තුළට ඇතුලත් කර ඇත. දමිළ මාධ්‍යයෙන් සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලි දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේ කටයුතු දිස්ත්‍රික් නිලධාරීන්ගේ සහය සහිතව සිදුකෙරෙමින් පවතී.

පාසල් තුළ ආපදා අවදානම අවමකිරීමට අදාළ තීන්දු තීරණ ගැනීමේදී මෙම මූලාශ්‍රය වැදගත් වන අතර ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ තාක්ෂණික ප්‍රවේශයන් සඳහා ද මහෝපකාරී වනු ඇත.

<u>ආපදා අවදානම් අවම කිරීම සඳහා අධි අවදානම් සහිත ක්ෂේත්‍ර හඳුනාගනිමින් ආපදා අවදානම් තක්සේරු සිදුකිරීමේ වැඩසටහන</u>

සෙන්දායි රාමුව අනුව වන ගෝලීය ක්‍රියාවලිය තුළ මෙන්ම දේශීයව ආපදා අවදානම් අවම කිරීම සඳහා වන උපාය මාර්ග සැලැස්ම අනුව ද තිරසර සංවර්ධන ඉලක්ක ලගාකර ගැනීම අරමුණු කරගත්තාවුත් ක්‍රියාවලියක අවශ්‍යතාවය අවධාරණය කර ඇත. ඒ අනුව ආපදා පාත්‍රතාවයට වැඩි සම්භාවිතාවක් පවතින ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින් එම ක්ෂේත්‍ර තුළ ආපදා අවදානම් අවම කිරීම සඳහා තාක්ෂණික ප්‍රවේශයක අවශ්‍යතාවය හඳුනාගන ඇත.

මෙහි දී විවිධ අවශ්‍යතා සහිත දරුවන් ජීවත්වන විශේෂිත රැකවරණ මධ්‍යස්ථාන, ළමා නිවාස, වැඩිහිටි නිවාස පිලිබඳව සැලකීමේ දී මොවුන් ආපදාවකට ගොදුරුවීමේ වැඩි හැකියාවක් ඇති පිරිසක් වන බැවින් මොවුන්ගේ ආපදා අවදානම තක්සේරු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර එම තක්සේරුව අනුව ආපදා අවදානම් අවමකිරීමට අදාළ තීන්දු තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම පහසුවනු ඇත.

ඒ අනුව 2020 වර්ෂය තුළ උක්ත කණ්ඩායම් පිළිබඳ ජාතික මට්ටමින් ආපදා අවදානම් තක්සේරුවක් සිදුකිරීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා උක්ත ක්ෂේත්‍රවලට අදාළ ද්විතීක දත්ත ඒකරාශී කිරීමෙන් අනතුරුව ප්‍රශ්නාවලි නිර්මාණය කර දත්ත ඒකරාශී කිරීම ආරම්භ කරන ලදී.

මේ වන විට දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි නිලධාරීන් දැනුවත් කර ප්‍රශ්නාවලි බෙදාහැරීම අවසන් කර ඇති අතර දත්ත ඒකරාශී කිරීම සිදුකෙරෙමින් පවතී. මේ සඳහා දත්ත පද්ධති නිර්මාණය කර ඇති අතර අන්තර්ජාලය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් දත්ත ඇතුළත් කිරීම සිදුකෙරෙමින් පවතී.

<u>පශ්චාත් ආපදා හානි පූර්ණය සඳහා රාජ්‍ය වැඩපිළිවෙල පිළිබඳ දැනුවත් කිරීම සඳහා මාර්ගෝපදේශයක් නිර්මාණය කිරීම</u>

ආපදා කළමනාකරණය පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රමුඛ වගකීමක් වන අතර පශ්චාත් ආපදා හානිපූර්ණය පිළිබඳ නිලධාරීන් සහ ප්‍රජාව නිසි දැනුවත් කිරීමකට ලක්කිරීම තුළින් ආපදා තත්වයකින් පසුව ප්‍රජාව සවිබලගැන්වීම සහ ප්‍රතිනිර්මාණය වේගවත් කළහැකි අතර එමඟින් ආපදාව හේතුවෙන් ප්‍රජාව පීඩාවට ලක්වීම අවම කිරීමටත් සමස්ත ආර්ථික ප්‍රතිසංවිධානය වේගවත් කිරීමටත් හේතුවනු ඇත.

‘‘පශ්චාත් ආපදා හානි පුර්ණය සඳහා රාජ්‍ය වැඩපිළිවෙල’’ පිළිබඳ මාර්ගෝපදේශයක් නිර්මාණය කිරීම තුළින් පශ්චාත් ආපදා හානි පූර්ණය පිළිබඳ නිලධාරීන් සහ ප්‍රජාව නිසි දැනුවත් කිරීමකට ලක්කිරීම සහ එමඟින් ආපදා තත්වයකින් පසුව ප්‍රජාව සවිබලගැන්වීම සහ ප්‍රතිනිර්මාණය වේගවත් කිරීම, ආපදාව හේතුවෙන් ප්‍රජාව පීඩාවට ලක්වීම අවම කිරීම සහ සමස්ත ආර්ථික ප්‍රතිසංවිධානය වේගවත් වීම සිදුවනු ඇත.

ඒ අනුව මේ වනවිට උක්ත අත්පොත සැකසීම සඳහා වන ද්විතීක දත්ත ඒකරාශී කිරීම සිදුකෙරෙමින් පවතින අතර අදාළ ආයතන හඳුනාගනිමින් මූලික සාකච්ඡා සිදුකෙරෙමින් පවතී.

4.3.8 ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිලිබඳ තක්සේරුකරණය කිරීම

ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරු කිරීමට අදාළ කටයුතු මෙම අංශය මඟින් ඉටුකෙරෙන අතර ඒ සඳහා දත්ත යාවත්කාලීන කිරීමට ක්‍රමවේද නිර්මාණය කිරීම සඳහා හඳුනාගත් ක්ෂේත්‍රයන්ගේ ධාරිතාවය වර්ධනය කිරීම ද මේ යටතේ සිදුකරනු ලැබේ. ඒ අනුව 2020 වර්ෂයේ උක්ත කාර්ය සඳහා ධාරිතාවය වර්ධනය කිරීමට ජාතික මට්ටමේ වැඩමුළු දෙකක් මේ වන විට සිදුකරන ලදී.

පාර්ශවකාර ආයතන නියෝජිතයින් සඳහා අභිමිවීම් හා හානි පිළිබඳ දත්ත පද්ධතිය හඳුන්වා දීම සහ මෙම දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුළත් කිරීම පිළිබඳ ප්‍රයෝගික පුහුණුකිරීමේ වැඩසටහනක් පැවැත්වූ අතර ඒ සඳහා ජාතික ජලසම්පාදන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියෝජන කරමින් 30 දෙනෙකු සහභාගී වන ලදී.

අභිමිවීම් සහ හානි තක්සේරුව පිළිබඳ දත්ත පද්ධතිය හඳුන්වාදීම සහ ඒ පිළිබඳ ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම සඳහා පුහුණුවන්නන් පුහුණුකිරීමේ වැඩමුළුවක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළධාරීන් 25 දෙනෙකු සඳහා සිදුකරන ලදී.

4.3.9 Desinventar දත්ත ගබඩාව

ආපදා අවදානම් අවම කරමින් සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම පර්යේෂණ කටයුතු පියවරෙන් පියවර දීර්ඝ කාලීනව පුළුල් පරාසයක් තුළ විහිදයන ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කලයුතු වේ. මෙහිදී ආපදා අවදානම් අවමකර ගැනීම පිළිබඳ අධ්‍යන සඳහා පාදක කරගැනීමට නිවැරදිව යාවත්කාලීන වන දත්ත පදනමක් අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම අවශ්‍යතාවය හඳුනාගත් අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් 2008 වසරේ සිට **Desinventra** දත්ත ගබඩාව පවත්වාගන යනු ලබන අතර **riskinfo** වෙබ් පිටුවද යාවත්කාලීන කරනු ලබයි. මෙම සියලු දත්ත අන්තර්ජාලය තුළ විවෘතව පවතින අතර මෙම දත්ත අවශ්‍ය ඕනෑම අයෙකුට අන්තර්ජාලය මඟින් නොමිලේ ලබාගැනීමේ පහසුකම ලබාදී ඇත.

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventra.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර එක් එක් සිද්ධීන්ට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුව අදාළ ආපදාවන් යටතේ අදාළ කාලයන් තුළ සිදුවූ මරණ, විපතට පත් ජනතාව හා හානියට පත් දේපල පිලිබඳ තොරතුරු සංඛ්‍යාත්මක වශයෙන් මෙම දත්ත පද්ධතියට ඇතුලත් කොට ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් හදිසි මෙහෙයුම් අංශයෙන් නිකුත් කරනු ලබන තත්ව වාර්තාවලින් මෙන්ම සෞඛ්‍ය, වනසංරක්ෂණ, වාරිමාර්ග සහ රිය අනතුරු පිළිබඳ පොලිස් වාර්තා (www.police.lk) වැනි අංශවලින් ලබාගන්නා තොරතුරු ද මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. මෙම දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන වන අතර නව දත්ත මූලාශ්‍රයන් හඳුනාගනිමින් වඩාත් නිවැරදි දත්ත පද්ධතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

දත්ත ගබඩා යාවත්කාලීන කිරීම පිළිබඳවත් දත්ත ගබඩා වැඩිදියුණු කිරීම පිලිබඳවත් දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු සිදුකරන ලදී.

4.3.10 riskinfo අවදානම් තොරතුරු වෙබ්අඩවිය (riskinfo web potal)

භූ විද්‍යාත්මක දත්ත (Geospatial Data) මෙම වෙබ්අඩවියට ඇතුළත් කිරීම (upload) මෙහිදී සිදුකරනු ලබයි. මෙම භූ විද්‍යාත්මක දත්ත දෙස් විදෙස් පර්යේෂකයින් විසින් භාවිතා කරනු ලබන අතර එමඟින් ආපදා සිදුවන, සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ අධ්‍යනය කිරීම්, තීරණ ගැනීම්, ඉදිරි සැලසුම් සැකසීම් සිදුකරනු ලබයි. කිසිදු අයකිරීමකින් තොරව අන්තර්ජාලය හරහා මෙම දත්ත ලබාගත හැකි අතර එමඟින් ආපදා කළමනාකරණය පිළිබඳ කටයුතු කරනු ලබන ආයතන සහ පුද්ගලයින් සඳහා සහයවීමත් පර්යේෂණ කටයුතු සඳහා දිරිමත් කිරීමත් සිදුකරනු ලබයි. විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් සඳහා අවශ්‍ය පුහුණු අවස්ථා ලබාදීම ද මේ හරහා අවම කිරීම්, පර්යේෂණ හා

සංවර්ධන අංශය මඟින් සිදුකරනු ලබන අතර එමඟින් ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා නව මානව සම්පත් බිහිවීම ද මෙහි අතුරු ප්‍රතිඵලයක් ලෙස හැදින්විය හැක.

මෙම වෙබ් අඩවි භාවිතය පිලිබඳව දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු සිදුකරන ලදී.



දිස්ත්‍රික් මට්ටමේ සේවයේ නියුතු ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ හදිසි මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුව (2020 අගෝස්තු 21)



දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීමේ තෙදින වැඩමුළුව (2020 අගෝස්තු 18 දින සිට 20 දක්වා)

<u>චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකර ආපදාවට පාත්‍ර වූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම</u>

ආපදා පෙර සුදානම් වීම සඳහා මෙන්ම හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම් සඳහා, ආපදා සිදුවිය හැකි සහ ආපදා සිදුවී ඇති ප්‍රදේශ මෙන්ම ආපදාවට ලක්වූ පිරිස් පිළිබඳ දත්ත ඉතාමත් වැදගත් සාදකයක් වේ. මෙම දත්ත ලබාගැනීම සඳහා නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් තොරතුරු අනාවරණය කිරීම අවමකරණ, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් කටයුතු කරනු ලැබේ. මෙහිදී කාලගුණ අනාවැකි පදනම් කර ගනිමින් ආපදා ඇතිවීමට පෙර සහ ආපදා ඇතිවීමෙන් පසු චන්ද්‍රිකා ඡායාරූප ලබාගෙන එම ඡායාරූප විශ්ලේෂණය මඟින් පවතින ද්වීතීක දත්ත පදනම් කරගනිමින් උක්ත තොරතුරු ලබාගැනීමට කටයුතු කෙරේ.

ජාත්‍යන්තර චන්ද්‍රිකා තාක්ෂණ ආයතන මඟින් මෙම ඡායාරූප ලබාගන්නා අතර ඒ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත විශේෂිත අවස්ථාවක් ‘‘ඉන්ටනැෂනල් චාටර්’’ (International Charter) සහ ‘‘සෙන්ටිනල් ඒශියා’’ (Sentinel Asia) යන ආයතන මඟින් ලබාදී ඇති අතර ආපදාවකට පෙර නිසි ක්‍රමවේද ඔස්සේ මෙම ආයතන වෙත දැනුම් දීමෙන් අනතුරුව එම ආපදා අවදානම් ප්‍රදේශ ආවරණය වන පරිදි චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීම සිදුකෙරෙන අතර ආපදාවට පෙර සහ පසු ඡායාරූප ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබාදීමට කටයුතු කෙරේ. තාක්ෂණික උපාංග භාවිතයෙන් මෙම ඡායාරූප විශ්ලේෂණය කිරීම ඉන් අනතුරුව සිදුකරනු ලැබේ. 2020 වර්ෂයේ ඇතිවූ ‘‘බුරවී’’ සුළිකුණාටුවට අදාළ විශ්ලේෂණ උක්ත විශ්ලේෂණ සිදුකරන ලදී.

4.3.11 දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

ආපදා අවම කිරීමට අදාළව මහජනතාව විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමුකරනු ලබන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබන අතර යොමුකර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම තීරණය වනු ඇත. මෙහිදී මෙම ලිපි සඳහා විසඳුම් ලබාදීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමුකරමින්, පවතින නීති රෙගුලාසි සහ ධාරිතාවයන් අනුව තාක්ෂණික නිර්දේශයන් ද සලකා බලමින් ජනතා අපේක්ෂා ඉටුකිරීමට දායකවීම අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශයේ පරමාර්ථය වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විෂය පරාසය තුළ වන ඉල්ලීම් සඳහා ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය හරහා අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකර එම පරීක්ෂණ වාර්තා පදනම් කරගනිමින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිසි ක්‍රමවේදයන් අනුව තීන්දු තීරණ ලබාගත අවශ්‍ය කටයුතු සිදුකර ඇත. මෙහිදී එක් එක් කාරණය අනුව ඊට අදාළ තාක්ෂණික ආයතනය සහ රේඛීය අමාත්‍යාංශය වෙත උක්ත ඉල්ලීම් යොමුකිරීම ද සිදුකෙරෙන අතර සෑම ලිපි ගනුදෙනුවකදීම ඉල්ලුම්කරු වෙත පිටපතක් යොමු කරමින් ඉල්ලුම්කරු දැනුවත් කිරීම සිදුකරනු ලබයි.

යොමුකරන ලද සෑම ලිපියකටම ලිඛිතව ප්‍රතිචාර දක්වා ඇති අතර සෘජුවම සිදුකල හැකි මහපෙන්වීම් සහ තාක්ෂණික දැනුවත්කිරීම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ඉල්ලුම්කරු වෙත සිදුකර ඇත. 2020 වර්ෂය තුළ මෙවැනි ලිපි 287ක් ලැබී ඇති අතර ඒ සියලුම ලිපි සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

4.3.12 වෙනත් ව්‍යාපෘතීන්

<u>JICA ව්‍යාපෘතිය</u>

කාලගුණික විපර්යාස හේතුවෙන් සිදුවන අවදානම් තත්ත්ව පාදක කරගනිමින් කැළණි ගඟ ද්‍රෝණිය තුළ පවතින අවදානම් අවමකිරීම සඳහා JICA ආයතනය සමඟ විශේෂිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවය ඇතිකරගනිමින් අදාළ ගිවිසුම්වලට එළඹීම 2019 වර්ෂය අවසානයේ සිදුවූ අතර ඒ පිළිබඳ කටයුතු කොවිඩ් 19 වසංගත තත්වයත් සමඟ මන්දගාමී විය.

මේ වන විට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාර්ශව ආයතන සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී.

4.4 හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (Emergency Operations Division)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධානතම අංශයක් වන හදිසි මෙහෙයුම් අංශය, පැය 24x7 පුරා ක්‍රියාත්මක වේ. එමෙන් ම ආපදා තත්ත්වයන් වර්ධනය වන ආකාරයත්, ප්‍රතිචාර සිදුකල යුතු මට්ටමත් අඛණ්ඩව තක්සේරු කරමින් ප්‍රතිචාර දැක්වීම සිදු කරයි. ආපදාවන්ගෙන් සිදු විය හැකි බලපෑම තක්සේරු කර ඒ අනුව සිදුවිය හැකි ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය පිළිබඳ තීරණ ගැනීමත්, එමඟින් ඉදිරියේදී මුහුණදීමට සිදුවන ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමට කටයුතු සැලසුම් කර විවිධ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේද භාවිතා කරමින් ජනතාව හා අදාළ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීම හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සිදු කරයි.



හදිසි මෙහෙයුම් මැදිරිය

2020 වර්ෂය තුළදී හදිසි මෙහෙයුම් අංශය විසින් ආපදාවන් අවම කිරීම හා පාලනය කිරීම, ජීවිත හා දේපල ආරක්ෂාව වෙනුවෙන් සියලු කටයුතු සඳහා දායකත්වයක් සපයමින් සම්බන්ධීකරණය සිදු කරන ලදී. ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් කිහිපයක් පහතින් දක්වා ඇත.

- මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවස්ථාවලදී මාර්ග එලි පෙහෙලි කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය.
- සන්නිවේදන සහ විදුලිබල සැපයීම් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය.
- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ සහාය ඇතිව විපතට පත්වූවන් සඳහා සහන ලබාදීම.
- ගිනි නිවාරණ කටයුතු සම්බන්ධීකරණය
- අනෙකුත් ආයතන හා පුද්ලගලයන් අතර සබඳතා ඇති කර ප්‍රතිචාර දැක්වීම.

4.4.1 2020 වසරේ සිදු වූ ආපදා හා සිදු කරන ලද හදිසි මෙහෙයුම්

<u>ගංවතුර</u>

2020 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ ජල ගැලීමෙන් පුද්ගලයන් **121,234**ක සංඛ්‍යාවක් විපතට පත් වූ අතර පවුල් **33,267**ක් ඉන් පීඩාවට පත් විය. කාලගුණ නිල නිවේදනයට අනුව බලපෑමට ලක් විය හැකි දිස්ත්‍රික්කයන් සියල්ල පිලිබඳ මාධ්‍ය, දුරකථන, ෆැක්ස්, අන්තර්ජාල, සමාජ ජාල හා වෙබ් අඩවි මගින් මහජනතාව අඛණ්ඩව දැනුවත් කිරීම සිදු කරන ලදී.

වගුව 4.7: ගංවතුර නිසා පීඩාවට පත් පුද්ගල හා පවුල් සංඛ්‍යාව (*මූලාශ්‍රය - Desinventar)*

වර්ෂය	ගංවතුර නිසා පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව	ගංවතුර නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව
2019	578,051	138,894
2020	121,234	33,267

පෙර සූදානම් වීම් සහ පූර්ව දැනුම්දීම් විධිමත්ව මෙම වසරේ දී සිදු කිරීම හේතුවෙන් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී ගංවතුර නිසා පීඩාවට පත් වූ පුද්ගල සහ පවුල් සංඛ්‍යාව අඩු මට්ටමක පවත්වා ගැනීමට හැකි විය.



ගංවතුර හේතුවෙන් කළු ගඟේ සිර වී ඇති කසල ඉවත් කිරීම



පුත්තලමේ ඇති වූ ගංවතුර හේතුවෙන් යට වූ නිවසක්

<u>“බුරවී” සුළි කුණාටුව</u>

දෙසැම්බර් 02 දින රාත්‍රී 10.30 ත් 11.30 අතර කාලයේදී ශ්‍රී ලංකාවේ ඊසානදිග වෙරළ තීරයේ තිරියායි සහ කුච්චවේලි අතරින් බුරවී සුළි කුණාටුව ශ්‍රී ලංකා ගොඩබිමට ඇතුළු විය. එමඟින් යාපනය, ත්‍රිකුණාමළය, මන්නාරම සහ මුලතිවු යන දිස්ත්‍රික්කයන්හි පමණක් සුළු වශයෙන් ආපදා තත්ත්වයන් වාර්තා වී තිබිණි.

සුළි කුණාටුව හේතුවෙන් අවතැන් වූ මහජනතාව සඳහා සූදානම් කර තිබූ සුරක්ෂිත මධ්‍යස්ථාන යාපනය දිස්ත්‍රික්කය තුළ 04ක් ද, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ 49ක් ද, මන්නාරම දිස්ත්‍රික්කය තුළ

08ක් ද සහ මුලතිවු දිස්ත්‍රික්කය තුළ 04ක් ද ඇතුළු සුරක්ෂිත මධ්‍යස්ථාන 65ක් පිහිටුවන ලදී. බුරවි සුළි කුණාටුව නිසා පීඩාවට පත් වූ පුද්ගලයන් හා පවුල් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

වගුව 4.8: බුරවි සුළි කුණාටුව හේතුවෙන් පීඩාවට පත් පුද්ගල සහ හානියට පත් දේපල සංඛ්‍යාව
(මූලාශ්‍රය - දෛනික තත්ත්ව වාර්තාව

දිස්ත්‍රික්කය	පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව	පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව	පූර්ණ නිවාස හානි	අර්ධ නිවාස හානි
යාපනය	134	522	15	170
කිලිනොච්චි	628	1949		
මන්නාරම	324	1114		
මුලතිවු	123	422		
එකතුව	**1209**	**4007**		

නායයෑම්

2020 වර්ෂය තුළ දිවයිනේ සිදු වූ නායයෑම් සිදු වූ දිස්ත්‍රික්ක අතරින් මහනුවර, නුවරඑළිය හා රත්නපුර දිස්ත්‍රික්ක ප්‍රධාන තැනක් උසුලයි. එමඟින් පවුල් 5ක පුද්ගලයන් 44ක් පීඩාවට පත් විය. එමෙන් ම ජීවිත හානි 5ක් ද, නිවාස හානි 9ක් ද වාර්තා විය.

වගුව 4.9: නායයෑම් හේතුවෙන් පීඩාවට පත් පුද්ගල හා පවුල් සංඛ්‍යාව (*මූලාශ්‍රය - Desinventar*)

වර්ෂය	නායයෑම් නිසා පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව	නායයෑම් නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව
2019	2374	656
2020	44	5

ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අනවසර ඉදිකිරීම් අවම කිරීම සහ හදිසි ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය මනා සම්බන්ධීකරණය තුළින් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ නායයෑම් නිසා පීඩාවට පත්වූ පුද්ගල සහ පවුල් සංඛ්‍යාව විශාල ලෙස අවම කර ගැනීමට හැකි වී ඇති බව ඉහත දත්ත විශ්ලේෂණය මඟින් පෙනී යයි.





<u>ප්‍රබල / දැඩි සුළං</u>

2020 වර්ෂයේ දැඩි සුළං හේතුවෙන් පුද්ගලයන් 73,131ක් සහ පවුල් 10,612ක් ඉන් විපතට පත් වූහ. එමෙන්ම ජීවිත හානි 12ක් ද, තුවාල වූ පුද්ගලයන් 64ක් වශයෙන් එම කාල වකවානුව තුළ වාර්තා විය. දැඩි සුළං තත්වය හේතුවෙන් විශාල වශයෙන් වව්නියාව දිස්ත්‍රික්කයේ ජනතාව පීඩාවට පත් විය.

වගුව 4.10: දැඩි සුළං හේතුවෙන් පීඩාවට පත් පුද්ගල හා පවුල් සංඛ්‍යාව (*මූලාශ්‍රය - Desinventar*)

වර්ෂය	දැඩි සුළං නිසා පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව	දැඩි සුළං නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව
2019	50,845	13,376
2020	73,131	10,612

අයහපත් කාලගුණික තත්ත්වය හේතුකොට ගෙන දැඩි සුළං නිසා 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාවේ වැඩි වීමක් ඇති බව ඉහත දත්ත විශ්ලේෂණය මඟින් පෙනී යයි. මේ සඳහා ස්ථිර නොවන ඉදිකිරීම් ද ඇතුළත් වී ඇත.

<u>කැලෑ ගිනිවලදී හදිසි අවස්ථා ප්‍රතිචාර කටයුතු</u>

2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව තුළ කැලෑ ගිනි 284 ප්‍රමාණයක් වාර්තා විය.

කැලෑ ගිනි පාලනය කිරීම සඳහා හදිසි මෙහෙයුම් මැදිරිය විසින් ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය සම්බන්ධීකරණය කිරීම තුළින් මෙම කැලෑ ගිනි පාලනය කිරීම සම්බන්ධීකරණය සිදු කරන ලදී.




වගුව 4.11: 2017 සිට 2020 වර්ෂ වල හටගත් කැලෑ ගිනි සංඛ්‍යාවන් මූලාශ්‍රය - දෛනික තත්ත්ව වාර්තාව

වර්ෂය	කැලෑ ගිනි ප්‍රමාණය
2017	58
2018	102
2019	131
2020	**284**

MT NEW DIAMAN තෙල් නැවේ ගින්න මැඩපැවැත්වීම සඳහා දායක වීම

MT NEW DIAMAN තෙල් නෞකාවේ ගින්න ඇති වූ අවස්ථාවේ එයට අදාළ තාක්ෂණික ආයතන වන සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) සමඟ සම්බන්ධීකරණය වෙමින් එමඟින් පරිසරයට තෙල් විසිරීමක් ඇති වුවහොත් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සඳහා සූදානම්ව සිටින ලදී. තෙල් නැවෙහි ගින්න පාලනය කිරීම ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඉන්දීය ගුවන් හා නාවික හමුදාවන් සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මැදිහත්වීමෙන් සිදුකරන ලදි.

2020 ජනවාරි 01 වන වැනි දින සිට **2020** දෙසැම්බර් 31 වන දින දක්වා ආපදා මඟින් සිදු වූ ජීවිත හා දේපළ හානි පිළිබඳ සාරාංශගත වගුව පහත දක්වා ඇත.

ආපදා මඟින් බලපෑමට ලක් වූ තොරුතුරුවල සාරාංශය (ආපදා කළමනාකරණ පනතෙහි සඳහන් ආපදා)

වගුව 4.12: ආපදා මඟින් බලපෑමට ලක් වූ තොරුතුරුවල සාරාංශය *මූලාශ්‍රය - Desinventar*

සිදුවීම	සිදුවීම් වාර්තා	මරණ	තුවාල වීම්	අතුරුදහන් වීම්	නිවාස විනාශවීම්	නිවාස හානි	බලපෑමට ලක්වූ පවුල් සංඛ්‍යාව	බලපෑමට ලක්වූ පුද්ගල සංඛ්‍යාව
ගස් කඩා වැටීම්	71	2	4	0	4	147	180	758
උදම් රළ	3	0	0	0	0	0	147	587
පිපිරීම	1	0	3	0	0	0	3	3
ගිනි ගැනීම්	86	2	0	0	94	45	165	682
ගංවතුර	119	4	4	0	8	2111	33267	121234
ක්ෂණික ගංවතුර	4	0	0	0	0	48	605	2486
කැළෑ ගිනි	284	0	0	0	0	0	0	0
නායයෑම්	5	3	2	0	2	7	9	44
අකුණු	85	9	6	0	0	173	186	716
කුණාටු	1	0	0	0	0	0	85	310
තද සුළං	480	12	64	0	30	50	59	217
සුළි සුළං	54	2	6	0	104	3577	27893	102278
ටොනාඩෝ	1	0	0	0	0	1	1	3
	1194	**34**	**89**	**0**	**242**	**6159**	**62600**	**229318**



සටහන 4.2: ආපදාවලින් සිදුව නිවාස හානි වීම්



සටහන 4.3: ආපදාවලින් බලපෑමට ලක් වූ පුද්ගල සංඛ්‍යාව



සටහන 4.4: ආපදාවලින් මරණයට පත්වීම්

<u>අනෙකුත් සිදුවීම් නිසා ඇති වූ බලපෑම්</u>

වගුව 4.13: ආපදා මඟින් බලපෑමට ලක් වූ තොරුතුරුවල සාරාංශය *මූලාශ්‍රය - Desinventar*

සිදුවීම	සිදුවීම් වාර්තා	මරණ	තුවාල වීම්	අතුරුදහන් වීම්	නිවාස විනාශවීම්	නිවාස හානි	බලපෑමට ලක්වූ පවුල් සංඛ්‍යාව	බලපෑමට ලක්වූ පුද්ගල සංඛ්‍යාව
සත්ත්ව ප්‍රහාර	17	15	45	1	0	1	39	69
බෝට්ටු පෙරලීම	1	0	0	2	0	0	0	0
දියේ ගිලීම්	36	47	7	6	0	0	17	71
විද්‍යුත් අනතුරු	4	5	0	0	0	0	2	6
භූමි කම්පා	1	0	0	0	0	1	1	4
භූමිය ගිලා බැසීම්	1	0	0	0	0	1	1	2
ගල් පෙරලීම්	27	0	0	0	0	24	53	215
කණ්ඩි කඩා වැටීම්	15	0	3	0	0	18	17	67

4.4.2 පූර්ව දැනුම්දීම්

පූර්ව දැනුවත් කිරීමේ කුළුණු යාන්ත්‍රිකව ක්‍රියා කරවීම සඳහා ත්‍රිවිධ හමුදා නිලධාරීන් පුහුණු කිරීම සිදු කර හදිසි ආවස්ථාවලදී ක්‍රියාත්මක කිරීමට පහසු වන පරිදි සකසන ලදී.

- සියලුම ප්‍රාදේශිය මාධ්‍ය වාර්තාකරුවන් පූර්ව දැනුම්දීමේ පද්ධතිය සමඟ සම්බන්ධ කරන ලදී.
- DEWN පද්ධතියේ ග්‍රාහකයන් ප්‍රමාණය 23,000 දක්වා වැඩි කිරීමට කටයුතු කරන ලදී.
- 2020 මහ මැතිවරණයට සමගාමීව මැතිවරණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වෙමින් හදිසි ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් නිර්මාණය කොට හදිසි ආපදා තත්ත්වයක දී මැතිවරණ කටයුතුවලට බාධා නොවී පැය 24x7 පුරාම මැතිවරණ කටයුතු සාර්ථක කිරීම සඳහා සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

4.4.3 ඇමතුම් මැදිරිය

- කොවිඩ් 19 වෛරසය හේතුවෙන් ජනාධිපති කාර්ය සාධක බලකායේ ඇමතුම් මැදිරිය ලෙස ස්ථාපිත 117 ඇමතුම් මැදිරියේ සිවිල් නිලධාරීන්ට අමතරව ත්‍රිවිධ හමුදාව, පොලිසිය, සෞඛ්‍ය අංශය ඇතුළු නිලධාරීන් මාස 04ක පමණ කාලයක් රාජකාරී කල අතර එම කාලය තුළ කොවිඩ් 19 වෛරසය සම්බන්ධ දුරකථන ඇමතුම් 122,979ක් සම්බන්ධව අදාළ අංශ දැනුවත් කර සම්බන්ධීකරණ කටයතු සිදු කරන ලදි.
- 117 ඇමතුම් මැදිරියේ දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම. මෙමඟින් සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරීවරුන්, සහන සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් ගේ දුරකථන අංක යාවත්කාලීන කිරීම සහ ගංවතුර සහ නායයෑම්වලින්

බලපෑමට ලක් වන දිස්ත්‍රික්ක 10ක ආපදාවට අදාළව ප්‍රතිචාර දක්වන තාක්ෂණික ආයතනවල සියළු නිලධාරීන්ගේ දුරකථන අංක ක්ෂණිකව ලබා ගත හැකි ආකාරයට දත්ත ගබඩාවක් සකස් කරන ලදී.

- 2020/01/01 සිට 2020/12/31 දක්වා ආපදාවන් සම්බන්ධ ඇමතුම් **369,215**ක් ඇතුළුව ඇමතුම් **401,771**කට ප්‍රතිචාර දැක්වීම සහ ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. මාසිකව ලැබුණු දුරකතන ඇමතුම්වල වාර්තාව පහත දක්වා ඇත.

වගුව 4.14: මාසිකව ලැබුණු දුරකතන ඇමතුම්වල වාර්තාව

කාල සීමාව	ආපදා සම්බන්ධ තොරතුරු විමසීමේ ඇමතුම්	වෙනත් ඇමතුම්	මුළු ඇමතුම් සංඛ්‍යාව
2020.01.01 සිට 2020.01.31 දක්වා	16,342	3,286	19,628
2020.02.01 සිට 2020.02.28 දක්වා	12,482	6,497	18,979
2020.03.01 සිට 2020.03.31 දක්වා	45,856	1,032	46,888
2020.04.01 සිට 2020.04.30 දක්වා	46,021	899	46,920
2020.05.01 සිට 2020.05.31 දක්වා	80,968	1,980	82,948
2020.06.01 සිට 2020.06.30 දක්වා	60,987	1,528	62,515
2020.07.01 සිට 2020.07.31 දක්වා	24,310	3,283	27,593
2020.08.01 සිට 2020.08.31 දක්වා	26,337	3,511	29,848
2020.09.01 සිට 2020.09.30 දක්වා	20,964	2,856	23,820
2020.10.01 සිට 2020.10.31 දක්වා	17,713	1,640	19,353
2020.11.01 සිට 2020.10.30 දක්වා	14,110	4,091	18,201
2020.12.01 සිට 2020.12.31 දක්වා	3,125	1,953	5,078
එකතුව	**369,215**	**32,556**	**401,771**



ඇමතුම් මැදිරිය

2020 වර්ෂයේදී හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා මිලදීගත් උපකරණ

වගුව 4.15: 2020 වර්ෂයේදී හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා මිලට ගත් උපකරණ

අංකය	මිලදී ගත් උපකරණ	ප්‍රමාණය	වැය වූ මුදල
01.	වැහි කබා (Rain Coat)	1000	1.80Mn
02.	උෂ්ණත්ව පරීක්ෂණ යන්ත්‍ර (thermometers)	50	0.375Mn
03.	දම්වැල් කියත් (Chain Saw)	30	3.120Mn
04.	බෝට්ටු එන්ජින් (OBM)	22	8.77Mn
05.	ශබ්ද විකාශන යන්ත්‍ර (PA System)	12	0.49Mn
06.	සෙවීම් පහන් (Flash lights)	200	0.49Mn
07.	ග්ලවුස් (Glows)	750	0.49Mn
08.	ගම් බූට්ස් (Gum Boots)	250	0.49Mn
09.	අයි පෑඩ් (I pad)	2	0.48Mn

4.4.4 හදිසි මෙහෙයුම් අංශය මගින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන්

- **ස්වයංක්‍රීය වර්ෂාමාන නිරීක්ෂණය**

  ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතියක්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කොට ඇත. එම දත්ත නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දීම මෙම වසර තුළදී සිදු වීම හා එමඟින් ශ්‍රී ලංකාවට ලැබෙන වර්ෂාමාන දත්ත එසැනින් දැන ගැනීමට හැකිවීම තුළ ආපදා කළමනාකරණය සිදු කිරීමට අවශ්‍ය තීන්දු තීරණ ලබා ගැනීම පහසු වී ඇත.



ස්වයංක්‍රීය වර්ෂාමාන නිරීක්ෂණ පද්ධතියේ මෘදුකාංගය

- **ඍතුවියේ සිදු වන භූමි කම්පා පිළිබඳව නිරීක්ෂණය හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.**

  ඉන්දු ඕස්ට්‍රේලියන් භූ කාරක තැටියේ පමණක් නොව ඍතුවියට අයත් සියලුම භූ කාරක තැටි තුළ හටගන්නා භූමි කම්පා පිළිබඳ තොරතුරු **USGS APP** මඟින් ලබා ගෙන එම තොරතුරු මත හා අවශ්‍යතාවය අනුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා පතල් හා කැණීම් කාර්යාංශය (**GSMB**) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් එම ආයතනවල තාක්ෂණික තොරතුරු අනුව සැලකිය යුතු මට්ටමින් භූමි කම්පා ඇති වූ විට ඒවා පිළිබඳ අදාළ දිස්ත්‍රික්කයන්හි ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දැනුවත් කිරීම හා අවශ්‍ය මහපෙන්වීම සිදු කර සුනාමි ඇති වීමට ඇති ඉඩකඩ පිළිබඳව දැනුවත් කිරීම සිදු කරනු ලබයි. 2020 වර්ෂයේදී **USGS APP** මඟින් හදිසි මෙහෙයුම් මැදිරිය වෙත 32,307ක පණිවිඩ ප්‍රමාණයක් ලැබී ඇත.

- **දෛනික තත්ත්ව වාර්තා පිළියෙල කිරීම.**

  දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලින් විධිමත් වූ ආකෘති භාවිතා කර ලබා ගන්නා තොරතුරු අනුව ජාතික මට්ටමින් දෛනික තත්ත්ව වාර්තා දිනකට තුන් වතාවක් යාවත්කාලීන කර අන්තර්ජාලය වෙත යොමු කරනු ලබයි. එසේම එම තත්ත්ව වාර්තා ජනාධිපති ලේකම් කාර්යයාලය, අගමැති ලේකම් කාර්යාලය හා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ද ෆැක්ස් මඟින් යොමු කරනු ලබයි.

- **ආපදා පෙරහුරු වැඩසටහන් සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.**

  සුනාමි, ජල ගැලීම් හා නායයෑම් පෙරහුරු වැඩසටහන් විවිධ මට්ටමින් සිදු කරනු ලබන අතර වාර්ෂිකව සුනාමි පෙරහුරු වැඩසටහන අන්තර්ජාතික හා කලාපීය මට්ටමින් සිදු කරනු ලබන අතර ඊට අවශ්‍ය තාක්ෂණික සහය හදිසි මෙහෙයුම් මැදිරිය තුළින් ලබා දෙනු ලබයි.

- **හදිසි මෙහෙයුම් මැදිරියේ දැනුවත් කිරීමේ වැඩසටහන්.**

  දේශීය/ විදේශීය ශිෂ්‍ය කණ්ඩායම්, ආරක්ෂක අංශයන්හි නිලධාරීන්, පාර්ශවකරුවන්, රාජ්‍ය නිලධාරීන් ආදී කණ්ඩායම් සඳහා හදිසි මෙහෙයුම්, පූර්ව දැනුම්දීම්, ආපදා කළමනාකරණය ආදී විෂයයන් පිළිබඳව වීඩියෝ සම්මන්ත්‍රණ මැදිරිය සහ හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය යොදා ගනිමින් කරන ලද දැනුවත් කිරීම් සිදු කරන ලදී.



හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානයේ දැනුවත් කිරීම් සිදු කරමින්

අභියෝග

- ආපදා කළමනාකරණ පනත මඟින් පනවන ලද ව්‍යවස්ථාදායක රාමුවට අනුව සහ ජාතික ව්‍යසන කළමනාකරණ සභාව සහ ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝගය යටතේ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ශක්තිමත් විය යුතුය.
- ආපදා අවදානම් කළමනාකරණය සඳහා සිරස් හා තිරස් සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම හා පහසුකම් සැපයීම.
- ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට ඇතුළත් කිරීම.
- පළාත් පාලන අංශයන් ආපදා කළමනාකරණය සඳහා දිස්ත්‍රික් මට්ටමින් ආපදා කළමනාකරණ ඒකක සමඟ සක්‍රීයව ආපදා අවස්ථාවලදී සම්බන්ධ නොවීම.
- කඩිනම් පුනුරුත්ථාපන සහ යථා තත්වයට පත් කිරීම සඳහා හදිසි මූල්‍යමය ප්‍රතිපාදනයක් නොමැති වීම.
- ආපදා කළමනාකරණ අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කිරීම.
- බහු උපද්‍රව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සහ සංවර්ධනය කිරීම.
- පවත්නා සන්නිවේදන ජාලය අළුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම.
- ජාතික ආපදා හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සහ දිස්ත්‍රික් හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
- ජාතික ආපදා කළමනාකරණ උපාය මාර්ගයන්ට අනුව සෙවීම් හා ගලවා ගැනීමේ කණ්ඩායම් දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපනය කර නොමැති වීම.
- හදිසි ප්‍රතිචාර දැක්වීමේදී සෙවීම් හා ගලවා ගැනීමේ කණ්ඩායම් සඳහා අවශ්‍ය හදිසි මූල්‍යමය ප්‍රතිපාදනයන් වෙනුවෙන් හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා වූ හදිසි අරමුදලක් (Emergency Fund) නොමැති වීම.
- දැනට පවත්නා සන්නිවේදන ජාලය සහ පෙර දැනුම් දීමේ ක්‍රියාවලිය සඳහා ස්ථාපිත ක්‍රමවේදයන් තුළින් බහු උපද්‍රව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක් නොමැති වීම.
- හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ඇති සම්පත් ප්‍රතිඵලදායී ලෙස හදිසි ප්‍රතිචාර සඳහා යොදා ගැනීමට නිසි ක්‍රමවේදයක් නොමැති වීම.

4.5 මූල්‍ය අංශය

4.5.1 2020 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය ප්‍රගතිය

2020 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා රුපියල් මිලියන 392.7ක ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරය විසින් ලබාදී තිබේ. එම ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 282ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුනරාවර්ථන වියදම් සඳහා වෙන් කර තිබූ අතර ඉන් රු.මි. 269ක් වියදම් කිරීමට හැකිවිය. ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 110.7ක් වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 104.3ක් වියදම් කර තිබේ. මෙම සමස්ත ප්‍රතිපාදනවලින් එකිනෙක වැය විෂයන් සඳහා 2020 දෙසැම්බර් 31 දින වනවිට පහත දැක්වෙන පරිදි වැයකර තිබේ.

වගුව 4.16: 2020 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය ප්‍රගතිය

වැය විෂය අංකය	වැය විෂය/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	මුළු ප්‍රතිපාදන (රු.මිලියන)	වියදම (රු.මිලියන)	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගති %
130-2-7-2-1503	**පුනරාවර්තන වියදම්**	**282**	**269**	**95**	**100**
	ප්‍රාග්ධන වියදම්				
130-2-7-2-2201 (i)	පුහුණු හා හැකියා වර්ධනය	1.09	1.08	99	100
130-2-7-2-2201 (ii)	කාර්යාලීය ලීබඩු උපකරණ, ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර සහ අනෙකුත් කාර්යාලීය උපකරණ මිලදී ගැනීම.	6.44	6.44	100	100
130-2-7-3-2509	දිස්ත්‍රික්කවල ආපදාවන්හි බලපෑම් අවමකිරීමට ආපදා වැළැක්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම	71.75	67.50	94	100
130-2-7-5-2509 (i)	ආපදා පෙරසුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත්කිරීම් - දැනුවත්කිරීම් අංශය	6.83	6.21	91	93
130-2-7-5-2509 (ii)	ආපදා පෙරසුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත්කිරීම් - පෙරසූදානම අංශය	5.5	4.54	83	85
130-2-7-8-2103	නායයෑම්,ගංවතුර හා නියහ අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ධාරිතා වර්ධනය	17.22	16.58	96	100
130-2-7-10-2509	ආපදා හානි අවම කිරීම හා සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහයට අන්තර්ගතකිරීම	1.94	1.94	100	100
	ප්‍රාග්ධන වියදම්වල එකතුව	**110.77**	**104.29**	**94**	**99**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශය

	සටහන	**2020** රු. **'000**	**2019** රු. **'000**
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල්වලට සමාන දෑ	03	10,257	33,458
තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ	04	9,502	2,010
පෙර ගෙවීම් සහ අත්තිකාරම්	05	2,067	3,775
භාණ්ඩ තොග	06	6,468	10,514
ආපදා ප්‍රතිචාර උපකරණ තොග	07	18,672	8,979
ගංවතුර, නායයෑම් විශේෂ ණය අත්තිකාරම්		-	90
වැඩ කෙරෙමින් පවතින අස්පෘෂ වත්කම්		174	-
		47,140	**58,826**
ජංගම නොවන වත්කම්			
අස්පෘෂ වත්කම්	08	10,200	11,648
දේපළ, පිරියෙත සහ උපකරණ	09	738,613	880,379
මුළු ජංගම නොවන වත්කම්		**748,813**	**892,027**
මුළු වත්කම්		**795,953**	**950,853**
වගකීම්			
ජංගම වගකීම්			
වෙනත් ප්‍රතිපාදන	10	206	206
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	11	10,233	51,675
		10,439	**51,881**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	12	47,970	39,310
වෙනත් සංවිධානවලින් ප්‍රදාන	13	16,244	14,425
මුළු ජංගම නොවන වගකීම්		**64,214**	**53,735**
මුළු වගකීම්		**74,653**	**105,616**

ශුද්ධ වත්කම්		**721,300**	**845,237**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
අරමුදල, සංචිත / ස්කන්ධය			
සමුච්චිත අරමුදල		(1,016,508)	(741,074)
ප්‍රාග්ධන ප්‍රධාන මත ආයෝජන	14	(53,651)	(219,953)
වත්කම්වල ප්‍රාග්ධන ප්‍රධානය - ICET ව්‍යාපෘතිය		400,186	520,489
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - මහා භාණ්ඩාගාරය		-	957
මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන		1,184,837	1,078,382
සංචිත ප්‍රත්‍යාගණනය - මෝටර් වාහන		206,436	206,436
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		**721,300**	**845,237**

මේ සමග ඉදිරිපත්කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අංක 1 සිට 18 දක්වා ඇති සටහන්, මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

නියෝජ්‍ය අධ්‍යක්ෂ මූල්‍ය (රා.ඉ.)

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. මූල්‍ය ප්‍රකාශන අනුමත කර, අන්තර්කාලීන කළමනාකරණ කමිටුව වෙනුවෙන් අත්සන් කෙරේ.

අධ්‍යක්ෂ ජනරාල් සාමාජික IMC සභාපති IMC

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

		2020	**2019**
	සටහන්	**රු. ‘ 000**	**රු. ‘ 000**
ආදායම	15	244,979	280,550
වෙනත් ආදායම්	16	149,180	152,045
මුළු ආදායම		394,159	432,595
පරිපාලන වියදම්	17	(450,164)	(488,379)
වෙනත් වියදම්	18	(10,715)	(9,249)
වෙනත් මෙහෙයුම්වල (අතිරික්තය / ඌණතාවය)		(66,720)	(65,033)
මූල්‍ය වියදම්		-	-
පෙර බදු (අතිරික්තය / ඌණතාවය)		(66,720)	(65,033)
බදු		-	-
වසර සඳහා මුළු අතිරික්තය (ඌණතාවය)		(66,720)	(65,033)

මේ සමඟ ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය

	ප්‍රාග්ධන ප්‍රධාන අක් මුදල්	ප්‍රාග්ධන ප්‍රදාන වත්කම් - මහා භාණ්ඩාගාරය	ප්‍රාග්ධන ප්‍රදාන වත්කම් ICET ව්‍යාපෘතිය	ප්‍රාග්ධන සංචිත නැවත ඇයකිරීම මෝටර් රථ	සමුච්චිත අතිරික්තය (ඌණතාවය)	මුළු ශුද්ධ වත්කම් ප්‍රමාණය
	රු. ‘ 000	රු. ‘ 000	රු. ‘ 000	රු. ‘ 000	රු. ‘ 000	රු. ‘ 000
2019 ජනවාරි 01 වන විට ශේෂය	**335,868**	**2,552**	**655,599**	**206,436**	**(142,062)**	**1,058,393**
පසුගිය වසරේ ගැලපීම්	-	-	-	-	-	-
2019 වසර සඳහා ක්‍රමක්ෂය	-	(1,595)	(135,109)	-	-	(136,704)
වසර තුළ ප්‍රාග්ධනය	208,535	-	-	-	-	208,535
වසර සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	(219,954)	-	-	-	-	(219,954)
2019 වසර සඳහා අතිරික්තය (ඌණතාවය)	-	-	-	-	(65,033)	(65,033)
2019 දෙසැම්බර් 31ට ශේෂය	**324,449**	**957**	**520,490**	**206,436**	**(207,095)**	**845,237**
පෙර වසරේ ගැලපීම්	-	-	-	-	11,240	11,240
2020 වසර සඳහා ක්‍රමක්ෂය	-	(957)	(120,303)	-	-	(121,260)
2020 වසර තුළ ලද ප්‍රාග්ධන	102,434	-	-	-	-	102,434
2020 වසර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	(49,631)	-	-	-	-	(49,631)
2020 වසර සඳහා අතිරික්තය (ඌණතාවය)	-	-	-	-	(66,720)	(66,720)
2020 දෙසැම්බර් 31ට ශේෂය	**377,253**	**-**	**400,187**	**206,436**	**(262,575)**	**721,300**

මේ සමඟ ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යාවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2020	**2019**
	රු. ' 000	**රු. ' 000**
පෙර බදු අතිරික්තය (ඌණතාවය)	**(66,720)**	**(65,033)**
ගැලපීම්		
ක්ෂය වීම්	164,771	180,623
වත්කම් ප්‍රාග්ධන ප්‍රදානයන්හි ක්‍රමක්ෂය	(121,260)	(136,704)
පාරිතෝෂික ගෙවීම්	(269)	(1,146)
මුදල් නොවන ලැබීම්	(3,638)	(2,992)
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	8,929	6,770
වත්කම් අපහරණ ලාබ	(11)	(92)
මුදල්මය නොවන ප්‍රදාන ලැබීම්	-	(1,187)
කාරක ප්‍රාග්ධන වෙනස් වීමට පෙර	**(18,198)**	**(19,761)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
මෙහෙයුම් අතිරික්තය / (ඌණතාවය)		
කාර්යය මණ්ඩල ගංවතුර / නායයෑම් විශේෂ ණය වැඩිවීම් / (අඩුවීම්)	90	119
වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්)	(7,492)	(314)
භාණ්ඩ තොග වැඩිවීම් / (අඩුවීම්)	4,046	653
ආපදා ප්‍රතිචාර දැක්වීමේ උපකරණ තොග වැඩිවීම් / (අඩුවීම්)	(9,693)	(41,008)
පෙර ගෙවුම් සහ අත්තිකාරම් වැඩිවීම / (අඩුවීම්)	1,708	(1,942)
වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම්)	(41,442)	(25,373)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(70,981)**	**(1,726)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
දේපල, පිරියෙත සහ උපකරණ අත්පත් කරගැනීම්	(6,680)	(6,260)
අස්පෘෂ වත්කම් - නොනිමි වැඩ	(174)	-
වත්කම් අපහරණ ලාභ	11	120
දේපල, පිරියෙත හා උපකරණ ගැලපීම්	-	12,873
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(6,843)**	**6,733**
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ප්‍රදාන ශුද්ධ වැඩිවීම් (ලැබීම්)	106,455	208,535

ප්‍රාග්ධන ශුද්ධ වැඩිවීම් (ගෙවීම්)	(53,651)	(219,953)
රා. නො. ස. / ජා. රා. නො. ස වලින් ශුද්ධ ප්‍රදාන	1,819	1,398
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**54,623**	**(10,020)**
මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ වෙනස්කම්	(23,201)	(5,013)
වසර ආරම්භයේදී මුදල් සහ මුදල්වලට සමාන දෑ	33,458	38,471
වසර අවසානයේ මුදල් සහ මුදල්වලට සමාන දෑ	**10,257**	**33,458**

සටහන A - මුදල් සහ මුදල්වලට සමාන දෑ	**රු. ‘ 000**	**රු. ‘ 000**
බැංකුවේ ඇති මුදල්	10,257	33,458
අතැති මුදල්	-	-
එකතුව	**10,257**	**33,458**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය කොටසක් නිරූපණය කරයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

අයවැය සහ සත්‍ය වියදම් සන්සන්දනාත්මක ප්‍රකාශනය 2020

ප්‍රාග්ධන වියදම්			**රු. 000**
වැය විස්තරය	**සංශෝධිත ඇස්තමේන්තුව 2020**	**සත්‍ය වියදම**	**අතිරික්තය / (ඌණතාවය)**
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - කාර්යය මණ්ඩලයේ ධාරිතා වර්ධනය	1,290	1,040	250
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය – වත්කම් සහ වෙනත් අත්පත් කර ගැනීම්	6,443	4,443	-
දිස්ත්‍රික්කවල ආපදාවන්හි බලපෑම් අවම කිරීමට ආපදා වැළැක්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම	71,747	67,504	4,243
නායයෑම්, ගංවතුර හා නියඟ අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ධාරිතා වර්ධනය	17,222	16,584	638
ආපදා පෙර සූදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම - දැනුවත් කිරීම් අංශය	6,830	6,203	627
ආපදා පෙර සූදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම් - පෙර සූදානම් අංශය	5,502	4,538	964
ආපදා හානි අවම කිරීම හා සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහයට අන්තර්ග්‍රහණය කිරීම	1,936	1,936	-
එකතුව	**110,970**	**102,248**	**6,722**

පුනරාවර්තන වියදම්			**රු. 000**
වැය විස්තරය	**සංශෝධිත ඇස්තමේන්තුව 2020**	**සත්‍ය වියදම**	**අතිරික්තය / (ඌණතාවය)**
වැටුප් හා වේතන	201,525	199,348	2,177
ගමන් වියදම් (දේශීය හා විදේශීය)	8,898	7,852	1,046
සැපයුම් සේවා	13,889	16,509	(2,620)
නඩත්තු සේවා වියදම්	22,987	16,782	6,205
කොන්ත්‍රාත් සේවා	29,367	28,340	1,027
වෙනත් වියදම්	4,584	4,333	251
එකතුව	**281,250**	**273,164**	**8,086**

** උපචිත පුනරාවර්තන වියදම් හේතුවෙන් අභිතකර විචල්‍යතා ඇති වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය කොටසක් නිරූපණය කරයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය			
අයවැය හා සත්‍ය වියදම් සන්සන්දනාත්මක ප්‍රකාශනය 2020			
පුනරාවර්තන වියදම්			**රු. 000**
වැය විස්තරය	සංශෝධිත ඇස්තමේන්තුව 2020	සත්‍ය වියදම	අතිරික්තය / (ඌණතාවය)
<u>පුද්ගලික දීමනා</u>			
වැටුප් හා වේතන	150,143	148,066	2,077
අතිකාල	18,956	19,373	(417)
වෙනත් දීමනා	32,426	31,909	517
	201,525	**199,348**	**2,177**
<u>සංයුක්ත දීමනා හා ගමන් වියදම්</u>			
දේශීය	7,538	6,992	546
විදේශීය	1,360	860	500
	8,898	**7,852**	**1,046**
<u>සැපයුම් සේවා</u>			
ලිපි ද්‍රව්‍ය සහ වෙනත් පරිභෝජන භාණ්ඩ	4,594	7,013	(2,419)
ඉන්ධන වියදම්	9,295	9,496	(201)
	13,889	**16,509**	**(2,620)**
<u>නඩත්තු සේවා</u>			
වාහන නඩත්තු	12,416	11,957	459
පිරියත යන්ත්‍රෝපකරණ සහ වෙනත් උපකරණ නඩත්තුව	10,571	4,825	5,746
	22,987	**16,782**	**6,205**
<u>සේවා</u>			
ප්‍රවාහන	132	43	89
විදුලිය හා ජලය	12,779	11,139	1,640
තැපැල් හා විදුලි සංදේශ	15,294	16,015	(721)
කුලී සහ බදු	1,162	1,142	20
වෙනත් (ආරක්ෂක, සනීපාරක්ෂක සේවා ආදිය)	4,583	4,333	250
	33,950	**32,672**	**1,278**

** උපචිත පුනරාවර්තන වියදම් හේතුවෙන් අභිතකර විචල්‍යතා ඇති වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය කොටසක් නිරූපණය කරයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු තොරතුරු

1.1 ස්ථානය හා නෛතික ස්වරූපය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යනු, ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ ජාතික සභාවට සහාය ලබා දීම පිණිස 2005 අංක 13 දරන පනත යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය විද්‍යා මාවත, කොළඹ 7 හි පිහිටා තිබේ.

ආපදා කළමනාකරණ ජාතික සභාව පිහිටුවීම සඳහා පනතින් ප්‍රතිපාදන සැළසෙන අතර ශ්‍රී ලංකාව තුළ ආපදා අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ ජාතික සභාවට සහාය දීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවයි. අමාත්‍යාංශයේ ලේකම් ගේ සභාපතිත්වයෙන් යුතුව ආයතනයේ මනා ක්‍රියාකාරීත්වය අරමුණු කරගෙන අන්තර්කාලීන කළමනාකරණ කමිටු පිහිටුවා තිබේ. තව දුරටත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

මධ්‍යස්ථානයේ කාර්යයන් පනතේ (1) උප කොටස යටතේ දක්වා තිබෙන අතර ඒවා පහත පරිදි වේ.

- ජාතික ආපදා කළමනාකරණ සැළසුම සහ ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සකස් කිරීමේ දී සභාවට සහාය ලබා දීම සහ එය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල යෝජනා ලබා දීම.
- ජාතික ආපදා කළමනාකරණ සැලසුම සහ ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දැරීම සහ ආපදා තත්ත්වයක් ප්‍රකාශ කළ අවස්ථාවක ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන විවිධ ආපදා කළමනාකරණ සැලසුම් ජාතික ආපදා කළමනාකරණ සැලසුමට අනුගත කිරීම.
- විවිධ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන ආපදා කළමනාකරණ සැලසුම් පදනම් කරගෙන පනතේ 10 වගන්තිය යටතේ ආපදා සූදානම, අවම කිරීම, වැළැක්වීම, සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතුවලට සැලසුම් සහ වැඩසටහන් සකස් කිරීම සහ එවැනි වැඩසටහන් සහ සැලසුම් ක්‍රියාත්මක කරන සංවිධාන සම්බන්ධීකරණය කිරීම එවැනි ක්‍රියාකාරකම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය ආධාර ලබා ගැනීම සහ එම මූල්‍ය ආධාර අදාළ ප්‍රදේශවලට නිදහස් කිරීම සහ එම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම.
- යෝග්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ආපදා කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් සඳහා උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ එම සංවිධාන සහ ලේකම්වරුන් සමඟ සහයෝගයෙන් වැඩ සටහන් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ආපදා කළමනාකරණයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ආපදා කළමනාකරණය පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම සහ නඩත්තු කිරීම.

1.3 ප්‍රධාන මෙහෙයුම ස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය විද්‍යා මාවත, කොළඹ 7හි පිහිටා ඇති අතර සෑම කච්චේරියකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක 25ක් පිහිටුවා තිබේ.

1.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබෙන්නේ ආයතනය අඛණ්ඩ පැවැත්මක් සහිත එකක් බව උපකල්පනය කරමින් ය. නුදුරු අනාගතය තුළ ආයතනයට අඛණ්ඩ පැවැත්මක් සහිතව කටයුතු කිරීමට ඇති හැකියාව පිළිබඳ කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් කර තිබේ. තවදුරටත් අඛණ්ඩ පැවැත්මක් සහිතව ඉදිරියට යාමට ආයතනය තුළ ඇති හැකියාවට සැලකිය යුතු අවිනිශ්චිත තත්ත්වයක් ඇතිකරන ද්‍රව්‍යාත්මක අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් වී නැති අතර ආයතනයේ මෙහෙයුම් නතර කිරීමට හෝ ආයතනය ඇවර කිරීමට හෝ ඔවුන්ගේ අදහසක් නොමැත. එමනිසා මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්මක් තිබේ යන පදනම මත ක්‍රියාත්මක වේ.

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.5 මූල්‍ය කාලසීමාව

නියෝජනය කරන ආයතනයේ මූල්‍ය කාල සීමාව 2020 ජනවාරි 1 සිට 2020 දෙසැම්බර් 31 දක්වා වේ.

1.6 මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ පදනම

1.6.1 අනුකූල වීමේ ප්‍රකාශය

මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශයන් සකස් කර තිබෙන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර තිබෙන නිර්ණායකවලට අනුකූලව වේ.

1.6.2 මිනුම්වල පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධ යෝග්‍ය හෙළි කිරීම් කර ඇති අවස්ථාවල හැර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම උපචිත පදනම අනුව සකස් කර තිබෙන අතර ඓතිහාසික වියදම් පදනම මත සිදු කර තිබේ.

1.6.3 සන්සන්දනාත්මක තොරතුරු

සමාන අයිතමයන් සහිත සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන වල වෙනම දක්වා තිබේ. වෙනස් ස්වාභාවයේ අයිතමයන් හෝ කටයුතු ඒවා ප්‍රමාණාත්මක නොවන අවස්ථාවල හැර වෙනම ඉදිරිපත් කර තිබේ.

1.6.4 ප්‍රමාණාත්මක බව සහ සමාහරණය

සමාන අයිතමයන් සහිත සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම දක්වා තිබේ. වෙනස් ස්වාභාවයේ අයිතමයන් හෝ කටයුතු ඒවා ප්‍රමාණාත්මක නොවන අවස්ථාවල හැර වෙනම ඉදිරිපත් කර තිබේ.

1.6.5 ශ්‍රිතයාත්මක සහ පිළිගැන්වීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශ ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ ආයතනයේ ශ්‍රිතයාත්මක සහ පිළිගැන්වීමේ ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබෙන සියළු මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති අවස්ථාවල ආසන්න රු. 1000ට සකස් කර තිබේ.

1.7 සැලකිය යුතු ගිණුම්කරණ තක්සේරු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සූදානම් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල ගිණුම්කරණ ප්‍රතිපත්තියට බලපාන විනිශ්චයන්, තක්සේරු සහ උපකල්පනයන් සිදු කිරීමට අවශ්‍ය වේ. ඊට ප්‍රතිඵල මෙම භාවිතා කරන ලද තක්සේරු සහ විනිශ්චයන්ගෙන් වෙනස් විය හැකිය.

i. නිශ්චිත දායකත්ව සැලසුම්

සේවකයාගේ පශ්චාත් සේවා දායක ප්‍රතිලාභ සැලසුම් තීරණය වන්නේ ආරක්ෂිත අනාගත මුදල් පිටතට ගලා ඒම් ක්‍රමය භාවිතා කරමින් වේ. එවන් ක්‍රමයන්වලට සාමාන්‍ය මාසික චේතනය සම්පූර්ණ කරන ලද වර්ෂ ගණන වර්ෂ අවසානයේදී සැළකිල්ලට ගනු ඇත. සැලසුමේ දීර්ඝ කාළීන ස්වභාවය අනුව එවන් ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතාවන්ට භාජනය වේ.

ii. ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්ගේ වෙනස්කම්

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්ගේ යම් වෙනස්කම් ඇත්නම් ඒවා මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වල හෙළි කරනු ලැබේ.

2. සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සාරාංශය

2.1 වත්කම් සහ ඔවුන්ගේ තක්සේරුවල පදනම්

2.1.1 දේපල, පිරියත සහ උපකරණ

1. හඳුනාගැනීමේ සහ ගණනය කිරීමේ පදනම

දේපල, පිරියත සහ උපකරණ හඳුනාගනු ලබන්නේ එම වත්කම්වලට අදාළ ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා එන බවත් එම වත්කම්වල වියදම විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි වන්නේ නම් පමණි.
සියලුම දේපල , පිරියත සහ උපකරණ ආරම්භයේදී වියදම මත සඳහන් කරන අතර ඉන් පසුව සමුච්චිත ක්ෂයවීම් සහ අපචය හානි අඩුකර ගණනය කරනු ලැබේ. අලුත්වැඩියා සහ නඩත්තු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ප්‍රකාශයක් තුළින් හඳුනාගන්නා අතර දේපල, පිරියත සහ උපකරණ අපචය වීම් සඳහාවන ධාරණ අගය අපචය වීම් සඳහා සමලෝචනය කිරීම සිදු කරන්නේ සිද්ධීන්ගේ වෙනස්වීම් හෝ සිද්ධීන් ධාරණ අගය නැවත අය කරගත නොැකි බවට අඟවන්නේ නම් පමණි.

2. ක්ෂයවීම්

ක්ෂය වීම් ගණනය කරනු ලබන්නේ සියලු දේපල, පිරියත සහ උපකරණවල විදයම මත සෘජු රේඛා ක්‍රමය උපයෝගී කරගෙන වන අතර එය සිදු කරනු ලබන්නේ එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත එම ප්‍රමාණයන් කපා හැරීම සඳහා වේ.

වත්කම්වල ඇස්තමේන්තුගත ආයු කාලය පහත පරිදි වේ:

වත්කම් කාණ්ඩය	ප්‍රයෝජනවත් ආයු කාලය
ත්‍රිවිධ හමුදා නවාතැන්, ගොඩනැගිලි	20
ගෘහ භාණ්ඩ	10
සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	20
විදුලි සංදේශ උපකරණ	5 -20
මෝටර් වාහන	5-10
පරිගණක	10
කාර්යාල උපකරණ	10

වත්කමක් ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතාව සඳහා තිබෙන අවස්ථාවේ සිට වන අතර එය අවසන් වන්නේ එම වත්කම අලෙවිය සඳහා යනුවෙන් වර්ගීකරණය කරන ලද මුල් දිනය සහ එම වත්කම හඳුනාගත් දිනයටය. දේපල පිරියත සහ උපකරණවල විවිධ ප්‍රයෝජනවත් ආයු කාළ සහිත සැලකිය යුතු අයිතමයන් වෙන වෙනම හඳුනාගෙන ක්ෂයවීම් කරනු ලැබේ.

<u>සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය</u>

3. ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

4. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලබන්නේ ඉවත් කිරීම මත හෝ එය භාවිතා කිරීමෙන් කිසිදු අනාගත ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විටයි. වත්කමක් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම මත ලැබෙන යම් කිසි ලැබීමක් හෝ අලාභයක් ගණනය කරනු ලබන්නේ ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ ධාරණ අගය අතර වෙනස ලෙස වන අතර එය වසර තුළ විස්තීරණ අදායම් ප්‍රකාශය තුළ ඇතුළත් කරන අතර වත්කම් ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ.

2.1.2 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එම වත්කම්වලට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒමේ හැකියාවත් වත්කම්වල හානිත් විශ්වසනීය ලෙස ගණනය කළ හැකි වන්නේ නම් පමණි.

<u>සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

2.1.3 භාණ්ඩ තොග

යල්පැන ගිය සහ සෙමින් වලනය වන අයිතම සඳහා නියමිත දීමනා ලබා දීමෙන් පසු භාණ්ඩ තොග අඩු මිලට සහ ශුද්ධ සාක්ෂාත් කරගත හැකි වටිනාකමින් සඳහන් වේ. ශුද්ධ සාක්ෂාත් කරගත හැකි වටිනාකම යනු සාමාන්‍ය ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත විකුණුම් මිල වන අතර එය නිම කිරීමේ සහ විකුණුම් වියදම්වල ඇස්තමේන්තුගත පිරිවැයට වඩා අඩුය. භාණ්ඩ තොග මිලදී ගැනීමේ මිල මත පදනම් වේ. භාණ්ඩ තොග අත්පත් කර ගැනීම සහ ඒවායේ පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද වියදම් පිරිවැයට ඇතුළත් වේ.

2.1.4 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, සක්‍රිය වෙළෙඳපොලේ සඳහන් නොවන ස්ථිර හෝ නිශ්චය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික වශයෙන් ණය සහ ලැබිය යුතු දෑ හඳුනාගනු ලබන්නේ ඒවා ආරම්භ වූ දවසේ සිටය. මුදල් නොගෙවීමේ අවදානම ආවරණය කිරීමට තිබෙන හිඟ මුදල්වලින් අඩු කොට එහි වියදම මත ණය සහ ලැබිය යුතු දෑ සඳහන් කරයි. ණය සහ ලැබිය යුතු දෑ යන්නට සේවක ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

2020 දෙසැම්බර් 31 දිනට පුනරාවර්තන වියදම් සඳහා එම වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ලැබුණු රුපියල් මිලියන 7.9ක භාණ්ඩාගාර ප්‍රදානය, මුදල් පොතේ සටහන් කර නොමැති මුළු ලැබිය යුතු රුපියල් මිලියන 9.5ද ඇතුළත් කර නියෝජනය කරයි.

2.1.5 මුදල් සහ මුදල්වලට සමාන දෑ

ආයතනය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල්වලට සමාන දෑ සලකා බලයි. මුදල් සහ මුදල්වලට සමාන දෑ යනු අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් වේ.

2.1.6 වගකීම් සහ ප්‍රතිපාදන

වගකීමක් ජංගම ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ බේරුම් කිරීමට අපේක්ෂා කරන අවස්ථාවන්හි දී වේ. එය මූලික වශයෙන් සේවයේ අනාගත අරමුණ වෙනුවෙන් පවත්වාගන්නා අතර වාර්තාකරණ කාළසීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත බේරුම් කළ යුතු අතර එසේ නැතිනම් වාර්තා කරන කාල සීමාව අවසානයේ අවම වශයෙන් මාස දොළහකට එම වගකීම විලම්බනය කිරීමට කොන්දේසි විරහිත අයිතියක් නැත. ආයතනය අනිත් සියලුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි.

2.1.7 ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් හඳුනාගන්නේ යම්කිසි අතීත සිදුවීමක් නිසා ආයතනයට යම්කිසි නෛතික හෝ අර්ථකාරී බැඳීමක් ඇති විට එම වගකීම බේරුම් කිරීම සඳහා වත්කම් පිටතට ගලා ඒමක් සිදුවීමට ඇති හැකියාවත් එම වගකීම විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකි වීමත් යන කාරණය තුළ වේ.

2019 දී ක්‍රියාත්මක කරන ලද අවම කිරීමේ ව්‍යාපෘතිවල නිම කරන ලද වැඩ සඳහා ගෙවිය යුතු මුදල ලෙස රුපියල් මිලියන 11.2ක මුළු වටිනාකම 2019 දී ලබා දී ඇති අතර, එය 2020 දී ආපසු හරවා යවා ඇති අතර, එය පෙර වර්ෂයේ ගැලපුම් ගිණුමක් ලෙස සටහන් කර ප්‍රකාශයේ දක්වා ඇත.

2.1.8 සේවක ප්‍රතිලාභ

1. සේවක ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනත යටතේ සේවකයන්ට පාර්තෝෂික ගෙවීමට ගිණුම්වල ප්‍රතිපාදන සලසා ඇති අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවකයන්ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තුළ සේවය කල කාල සීමාව සඳහා මූල්‍ය වර්ෂය අවසානයේ වන වැටුපෙන් හරි අඩක ප්‍රමාණයට ගණනය කරන ලද වැටුප ගෙවනු ලැබේ. මෙම අයිතමය විවිධ වගකීම් යටතේ කාණ්ඩ කරනු ලැබේ. මෙම ප්‍රතිපාදනය බාහිර වශයෙන් මූල්‍යකරණය කර හෝ ආයුගණක ලෙස ගණනය කර නැත.

<u>සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

2. නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුව සේවකයන් සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වයන්ට හිමිකම් කියයි. මේවා විස්තීරණ අදායම් ප්‍රකාශයේ දරන ලද වියදම් ලෙස හඳුනාගනු ලැබේ. ආයතනය දළ පාරිශ්‍රමිකවලින් 12%ක් සහ 3%ක් වශයෙන් සේවයකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායකත්වය සපයයි.

2.1.9 විදේශ මුදල් ගණුදෙනු පරිවර්තනය

ශ්‍රී ලංකා රුපියල් නොවන මුදල්වලින් සිදුවන ගනුදෙනු එම ගණුදෙනු සිදුකරන දිනයේ තත්‍ය අනුපාත මත ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලබයි.

2.1.10 අරමුදල්, ප්‍රදාන සහ සංචිත උපයෝජනය සහ ලාබාගනැනීම සම්බන්ධයෙන් වන ගිණුම්කරණය

ආයතනයට විශේෂිත සංවර්ධන ක්‍රියාකාරකම් සහ වැඩසටහන් සඳහා විවිධ ප්‍රදානයන් ලැබෙන අතර ඒවා අරමුදල් උපයෝජනය කළ වර්ෂයේ සහ ප්‍රදාන ලැබුණු වර්ෂයේ ආදායම් සහ වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

2.1.11 මෝටර් රථ නැවත තක්සේරු කිරීම

කොළඹ මෙට්‍රෝ කලාපයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් 2018 පෙබරවාරි 21 වන දින මෝටර් රථ නැවත ඇගයීම සිදු කර ඇත. තවද එම ව්‍යාපාරයේ දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතු වූ මෝටර් රථවල සම්පූර්ණ වත්කම් ප්‍රමාණය නැවත තක්සේරු කර ඇත. එය ඇස්තමේන්තුගත වටිනාකමට අනුව මෝටර් වාහනවල රැගෙන යා හැකි වටිනාකම රුපියල් මිලියන 206.4 කින් වැඩි කර ඇත. එම අගය ප්‍රාග්ධන සංචිත යටතේ නැවත තක්සේරු කිරීමේ සංචිත ලෙස සටහන් කර ඇත. තවද, එම මුදල මූල්‍ය තත්ත්වය සහ කොටස්වල වෙනස්වීම් ප්‍රකාශයේ වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 2020

	2020	**2019**
	රු. 000	**රු. 000**
සටහන 03 - මුදල් සහ මුදල් සමානකම්		
ලංකා බැංකුව - 2744646	10,257	33,458
සුළු මුදල්	-	-
	10,257	**33,458**
සටහන 04 - තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු දෑ		
Dongles මත තැන්පතු	3	3
තැන්පතු - ලංකා විදුලිබල මණ්ඩලය	1,109	1,108
තැන්පතු - ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය	52	52
වෙනත් ලැබිය යුතු දේ	8,338	847
	9,502	**2,010**
සටහන 05 - පෙරගෙවුම් සහ අත්තිකාරම්		
උත්සව අත්තිකාරම්	113	63
UNDP අත්තිකාරම්	94	595
මුද්දර අත්තිකාරම්	-	20
පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු සහ වෙනත් මත පෙරගෙවුම්	1,806	2,542
අත්තිකාරම් - මුදල් ප්‍රධාන කාර්යාලය	9	-
අත්තිකාරම් - මුදල් දිස්ත්‍රික්ක	4	-
අත්තිකාරම් - දිස්ත්‍රික්කවල සූදානම සහ සැලසුම්	4	491
අත්තිකාරම් - ඉන්ධන දිස්ත්‍රික්ක	37	64
	2,067	**3,775**
සටහන 06 - භාණ්ඩ තොග		
ලිපි ද්‍රව්‍ය	653	3,830
පරිගණක ටෝනර් සහ කාට්රිජ්	3,067	3,247
පත්‍රිකා	224	224
පොත් පිංච	1,410	1,440
වාහන අලුත්වැඩියාව සහ නඩත්තුව	929	1,711
වෙනත්	62	62
පෝස්ටර්	123	-
මුළු එකතුව	**6,468**	**10,514**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020

සටහන 07- තොග වශයෙන් ඇති ආපදා ප්‍රතිචාර උපකරණ		**2020**		**2019**
අයිතමය	**ප්‍රමාණය**	**මුළු වටිනාකම**	**ප්‍රමාණය**	**මුළු වටිනාකම**
		රු. '000		**රු. '000**
දම්වැල් කියත්	40	3,671	-	-
ජීවිතාරක්ෂක කබා	270	945	402	2,881
බෝට්ටු එන්ජින්	22	8,778	45	2,723
බෝට්ටු (බඳ)	1	195	1	195
ආ.ක.ම. හඳුනාගැනීමේ කබා	423	209	1023	227
මැනුවල් සයිරන්	2	49	2	49
වර්ෂාමාන	50	138	452	523
මන්න කැති	11	11	1001	11
සෙවීම් හා මුදවා ගැනීමේ කබා	1	59	88	59
සර්ච් ලයිට්	253	589	57	106
කැටමරන්ස්	3	372	43	124
PA පද්ධති	12	500	10	759
759759 වැය ශීර්ෂ 7 යටතේ මිලට ගත් ගම් බූට්	258	504	13	17
ජෙනරේටර්	1	38	1	38
ආ.ක.ම. හඳුනාගැනීමේ කබා - UNDP	825	408	1350	408
බේරාගැනීමේ බෑග්	80	132	580	132
ජල ටැංකි 1000L 1000 l	46	373	46	373
රබර් අත්මේස්	236	41	236	41
මුහුණු ආවරණ	25	4	780	105
පොරෝ	5	4	100	4
සම් අත්වැසුම් STC	750	491	-	-
වැහි කබා	231	427	174	52
වතුර පොම්ප BGVSP 2 SP	2	62	5	62
ටාපෝලින් - NDRSC	30	67	167	90
හදිසි බේරා ගැනීමේ බෝට්ටු	-	-	12	-
උෂ්ණත්වමානය	40	300	-	-
සුනාමි ටවර් බැටරිය 12V, 100AH සෝලර් ජෙල්	8	305	-	-
මුළු එකතුව		**18,672**		**8,979**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020

සටහන 08 - අස්පෘශ්‍ය වත්කම්

	2020.01.01 දිනට මුළු වියදම	වසර තුළ එකතු කිරීම් / මාරු කිරීම්	වසර තුළ මාරු කිරීම් / බැහැර කිරීම්	2020.12.31 දිනට මුළු වියදම	2020.01.01 දිනට ධාරණ අගය
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
වියදම					
GIS දත්ත	8,556	-	-	8,556	7,700
මෘදුකාංග	6,657	-	-	6,657	3,948
	15,213	**-**	**-**	**15,213**	**11,648**

	2020.01.01 දිනට සමුච්චිත ශේෂය	වසර සඳහා ක්ෂය කිරීම්	වසර මාරුවීම් අතරතුර ක්‍රමක්ෂය කිරීම	2020.12.31 දිනට සමුච්චිත ශේෂය	2020.12.31 දිනට ධාරණ අගය
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
ක්‍රමක්ෂය					
GIS දත්ත	856	856	-	1,711	6,844
මෘදුකාංග	2,709	593	-	3,302	3,355
	3,565	**1,449**	**-**	**5,013**	**10,200**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020

සටහන 09 - දේපල, පිරියෙත සහ උපකරණ

	2020.01.01 දිනට මුළු ඇස්තමේන්තු වටිනාකම	වසර තුළ එකතු කිරීම් / මාරු කිරීම්	වසර තුළ මාරු කිරීම් / බැහැර කිරීම්	2020.12.31 දිනට මුළු පිරිවැය	2020.01.01 දිනට කපා හරින ලද අගය
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
ස්ථාවර වත්කම්					
ත්‍රිවිධ හමුදා නවාතැන් ගොඩනැගිල්ල	-	1,291	-	1,291	-
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	427,322	-	-	427,322	229,544
කාර්යාල උපකරණ (උප සටහන - 9:1)	62,125	11,154	445	72,834	32,752
ගෘහ භාණ්ඩ සහ උපාංග	15,861	574	-	16,435	8,109
පරිගණක සහ උපාංග	100,535	8,537	695	108,377	31,174
මෝටර් රථ (උප සටහන - 9:2)	355,752	-	60	355,693	276,123
විදුලි සංදේශ උපකරණ	1,562,736	-	-	1,562,736	302,677
එකතුව	**2,524,331**	**21,556**	**1,200**	**2,544,688**	**880,379**

	2020.01.01 දිනට සමුච්චිත ශේෂය	වසර සඳහා ප්‍රතිපාදන / ගැලපුම්	වසර තුළ ගැලපීම් සඳහා	2020.12.31 දිනට මුළු පිරිවැය	2020.12.31 දිනට කපා හරින ලද අගය
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
ක්ෂය වීම්					
ගොඩනැගීම සහ ව්‍යුහය	-	13		13	1,278
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	197,778	21,366		219,144	208,178
කාර්යාල උපකරණ	29,373	4,392	445	33,321	39,514
ගෘහ භාණ්ඩ සහ උපාංග	7,751	1,178		8,929	7,505
පරිගණක	69,361	7,772	695	76,438	31,939
වාහන	79,630	35,569	60	115,139	240,553
විදුලි සංදේශ උපකරණ	1,260,060	93,032		1,353,091	209,645
එකතුව	**1,643,953**	**163,322**	**1,200**	**1,806,075**	**738,613**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020

සටහන 09 - දේපල, පිරියෙත සහ උපකරණ

උප සටහන 09:1 – කාර්යාල උපකරණ - ප්‍රදර්ශන මෙවලම් සහ උපකරණ

අනු අංකය	අයිතම විස්තර	ප්‍රමාණය	වටිනාකම (රු.'000)
1	අතේ ගෙන යා හැකි පසුබිම්	18	1,526
2	කුටි කවුන්ටර	18	445
3	රූපවාහිනිය	18	2,237
4	රූපවාහිනී ස්ථාවරය	18	871
5	බැනර් අදිනය	54	417
6	සුනාමි කුළුණ ආකෘතිය	18	1,975
7	නැමිය හැකි පුටු	18	76
8	කාපට්	9	190
9	අත් පත්‍රිකාව ස්ථාවරය	35	712
10	ඉදිරිපත් කිරීමේ පොයින්ටර්	30	240
11	PA පද්ධතිය (අතේ ගෙන යා හැකි)	12	2,050
12	සම්මත කාර්මික පංකා	18	371
	මුළු වටිනාකම		**11,110**

- අංක 18 දිස්ත්‍රික් ඒකක අතර ප්‍රදර්ශන මෙවලම් බෙදා හැර ඇති අතර එම භාණ්ඩවල වටිනාකම අංක 03 සටහන යටතේ කාර්යාල උපකරණ පන්තියට ඇතුළත් කර ඇත. මෙම උපකරණ 2017/2018 සිට සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් මට්ටමේ පාසල් ප්‍රදර්ශනයේ සහ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සඳහා භාවිත කෙරේ.

සටහන 09 - දේපල, පිරියෙත සහ උපකරණ

උප සටහන 09:02 - මෝටර් රථ

අනු අංකය	වාහන වර්ගය	ප්‍රමාණය	වටිනාකම **(රු. 000)**
01	ද්විත්ව කැබ් රථ	30	169,900
02	ජීප් රථ	1	13,000
03	විධාන රථ	1	5,500
04	වෑන් රථ	2	13,000
05	මෝටර් ලොරීස්	1	1,800
06	KDH වෑන්	1	8,500
07	ට්‍රැක්ටර් බවුසර්	80	143,993
මුළු වටිනාකම			**355,693**

- දිස්ත්‍රික් මට්ටමින් ක්ෂණික ප්‍රතිචාර දැක්වීම සහ ආපදා කළමනාකරණ සහ සම්බන්ධීකරණ කටයුතු සඳහා සෑම දිස්ත්‍රික් ඒකකයකටම ද්විත්ව කැබ් රථ අංක 25ක් පවරා ඇති අතර, සෑම දිස්ත්‍රික් ඒකකයකම සහකාර අධ්‍යක්ෂවරයා ඇත. නියඟ තත්ත්වය මත සාමාන්‍ය ජනතාවට පානීය ජලය සැපයීම සඳහා වඩාත් අවදානමට ලක්විය හැකි දිස්ත්‍රික්ක 16 අතරට ට්‍රැක්ටර් සවිකළ බවුසර් අංක 80ක් බෙදා දී ඇත. අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් පරිපාලන හා මෙහෙයුම් කටයුතු පැවරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ වෙනත් වාහන භාවිතා කෙරේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020
සටහන 10 - වෙනත් විධිවිධාන

	2020	2019
	රු. 000	රු. 000
කොටස් අහිමි වීම සඳහා ප්‍රතිපාදන*	206	206
	206	206

* 2007 වසරේ වේයන්ගොඩ ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ගබඩාවෙන් රුපියල් 206, 011.56ක වටිනාකමකින් යුත් ආපදා ප්‍රතිචාර උපකරණ අස්ථානගත වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම සහ නැතිවූ භාණ්ඩ භාරයේ සිටි නිලධාරියාට එරෙහිව විනය පියවර ගෙන ඇත. ඉන්සියුලර්ගේ සොයාගැනීම් මත, නිලධාරියාගේ සේවා කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. අත්තනගල්ල දිසා අධිකරණයේ අංක 1153/M දරන නඩුවේ තීන්දුව තවමත් පවතියි.

2020 දෙසැම්බර් 31 වන දිනට DMC විසින් හසුරුවන ලද නීතිමය නඩු සංඛ්‍යාව 07ක් (ඉහත එකත් සමඟ) ඇති අතර, ඉන් රිය අනතුරක් සම්බන්ධයෙන් නඩු අංක එම්/43/14 සහ ඩබ්ලිව්.ජේ.එම්. නවරත්න (ඩීඑම්සී හි හිටපු සේවක) සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් ඉල්ලා අස්කරගෙන ඇත. තවද, නඩු අංක CHC 999/2018/MR මගින් ද වලංගු ගිවිසුමක් නොමැති බව තීරණය කර ඇත.

නීත්‍යානුකූල හෝ වලංගු ගිවිසුම්ගත බැඳීමක් නොමැති වීම හේතුවෙන් DMC මෙම නඩු සඳහා කිසිදු ප්‍රතිපාදනයක් ලබා දී නොමැත.

සටහන 11 - අනෙකුත් ගෙවිය යුතු දේ

	රු. 000	රු. 000
ගෙවිය යුතු වැටුප් සහ වැටුප්	1	30
ගෙවිය යුතු EPF	2,610	2,478
ගෙවීම සහ SRL	-	2
ගෙවිය යුතු අතිකාල	2,356	1,878
ගෙවිය යුතු ගමන් වියදම්	762	926
ගෙවිය යුතු ඉන්ධන වියදම්	107	271
ගෙවිය යුතු වාහන සේවාව, නඩත්තු කිරීම සහ අලුත්වැඩියාව	73	560
ගෙවිය යුතු කුලී සහ දේශීය බදු	77	69
තැපැල් සහ සන්නිවේදනය	2,278	1,217
ගෙවිය යුතු විදුලිය සහ ජලය	632	938
ගෙවිය යුතු වෙනත් සේවාවන්	42	14
ගෙවිය යුතු කාර්ය මණ්ඩල සුබසාධනය	-	4
ගෙවිය යුතු අවම කිරීමේ ව්‍යාපෘති	-	42,629
ගෙවිය යුතු ආරක්ෂක සේවා	101	113
ගෙවිය යුතු සනීපාරක්ෂක සේවා	98	7
ගෙවිය යුතු වාර්ෂික විගණන ගාස්තු	1,004	539
කාර්මික ආරක්ෂණ උපකරණ පෞද්ගලික ආයතනය	92	-
	10,233	**51,675**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020

සටහන 12 - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

	2020	**2019**
	රු. 000	**රු. 000**
2020 ජනවාරි 1 වන දිනට ශේෂය	39,310	33,686
වර්ෂය සඳහා ප්‍රතිපාදන	8,929	6,770
ගෙවීම	(269)	(1,146)
ශේෂය 2020 දෙසැම්බර් 31 දිනට	**47,970**	**39,310**

1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා ඇත්තේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සමඟ සේවය කරන සෑම වසරකම මූල්‍ය වර්ෂයේ අවසාන මාසයට මාස භාගයක වැටුපෙන් ගණනය කරන ලද සේවකයන්ටය. මෙම අයිතමය විවිධ වගකීම් යටතේ කාණ්ඩගත කර ඇත. ප්‍රතිපාදනය බාහිරව අරමුදල් සපයනු ලබන අතර එය සත්‍ය වශයෙන් අගය කර නොමැත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020	**2020**	**2019**
	Rs. '000	**Rs. '000**
සටහන 13 - වෙනත් සංවිධානවලින් ප්‍රදානය		
Oxfam ලැබුණු වර්ෂාමාන ආධාර	-	357
UNDP ආ.ක.ම. හඳුනාගැනීමේ කඹා	630	628
වර්ල්ඩ් විෂන් ලංකා	-	28
ADPC	-	265
CSE	-	234
තොරතුරු තාක්ෂණයට අදාළ මිලට ගැනීම්	358	38
ලෝක සෞඛ්‍ය සංවිධානය - WHO	5,353	514
දැයට කිරුළ සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	-	121
UNHABITAT අදියර II	-	86
ADPC ආරක්ෂිත දිනය	-	33
ජාත්‍යන්තර සම්මේලන/වැඩමුළුව සඳහා SAARC	1,756	1,756
ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සඳහා UNDP	-	1,104
RSSDP සඳහා UNDP	160	160
බිම් මට්ටම සඳහා සමාකරණ අභ්‍යාස සංවර්ධනය සඳහා UNDP	372	668
LGS වෙත DRR ප්‍රධාන ප්‍රවාහය සඳහා UNDP	1,000	1,000
ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සඳහා UNDP	-	5
1% පරිපාලක පිරිවැය - ව්‍යාපෘති අවසන්	769	768
NDRSC වෙතින් ආපදා අවම කිරීමේ උපකරණ පරිත්‍යාග	3,111	5,093
CRIWMP ව්‍යාපෘති සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ අරමුදල් ආධාර	226	715
පාසල් සුනාමී වැඩසටහන සඳහා UNDP	788	852
2020 සම්මන්ත්‍රණය සඳහා UNDP අරමුදල්	773	-
ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ අරමුදල	948	-
මුළු හිඟ මුදල් සහ උපකරණ	**16,244**	**14,425**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020	**2020**	**2019**
සටහන 14 - ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජනය	**Rs. '000**	**Rs. '000**
<u>ප්‍රාග්ධන ජන්ද වියදම්</u>		
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - කාර්ය මණ්ඩල ධාරිතාව ගොඩනැගීම සහ පුහුණුව	972	3,000
දිස්ත්‍රික් මට්ටමින් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	36,009	105,498
ගංවතුර හදිසි අවස්ථා සඳහා උපකරණ මිලදී ගැනීම	4,338	54,693
ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාවගේ සූදානම	4,428	16,700
ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම	5,995	16,202
ශ්‍රී ලංකාව සඳහා බහු උපද්‍රව අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම	-	8,450
ගංවතුර, නායයෑම් සහ ආපදා අවම කිරීම් යාන්ත්‍රණයේ ධාරිතාව ශක්තිමත් කිරීම	-	10,996
සංවර්ධනය සඳහා ප්‍රධාන ප්‍රවාහය ආපදා අවදානම අඩු කිරීම	1,909	4,414
මුළු වියදම	**53,651**	**219,953**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020	**2020**	**2019**
	Rs.'000	**Rs. '000**
සටහන 15 - ආදායම		
පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදානය	244,979	280,550
එකතුව	**244,979**	**280,550**

මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදානය LKAS 20 - රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම අනුව පිළිගෙන ඇත. එමෙන්ම SLPSAS 11, ප්‍රමිතියට අනුව ප්‍රදාන ලැබෙන බවට සාධාරණ සහතිකයක් ලැබෙන තුරු රජයේ ප්‍රදාන හඳුනා නොගත යුතුය. එබැවින්, ආ.ක.ම. විසින් 2020 දෙසැම්බර් 31 වන දිනට පුනරාවර්තන ප්‍රදානයන් ලැබීම පමණක් එහි ආදායම ලෙස හඳුනාගෙන ඇත. නමුත් ආදායමට වඩා වියදම් සිදු වූ පදනම මත සලකා ඇත.

සටහන 16- වෙනත් ආදායම්	**Rs. '000**	**Rs. '000**
Oxfam වෙතින් ආධාර	385	691
UNDP වෙතින් ආධාර	1,302	260
ලෝක ආහාර වැඩසටහනේ සහාය (WFP)	6,368	-
ADPC වෙතින් සහය	250	-
තොරතුරු තාක්ෂණ සම්බන්ධ උපකරණ A/C	188	-
ටෙන්ඩර් තැන්පතු - ආපසු ගෙවිය නොහැක	17	10
විවිධ ආදායම්	230	1,337
ප්‍රාග්ධන ප්‍රදාන මත ක්‍රමක්ෂ කිරීම (උප සටහන - 16:1)	121,260	136,705
WHO වෙතින් සහය	11,983	2,410
Janathakshana ආධාර	2,049	-
ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සඳහා UNDP වෙතින් සහාය	1,100	-
Sendai Framework සඳහා UNDP වෙතින් සහය	-	981
බිම් මට්ටම සඳහා සමාකරණ අභ්‍යාස සංවර්ධනය සඳහා UNDP වෙතින් සහාය	296	-
NDRSC වෙතින් සහය	2,317	4,112
CRIWMP සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් සහය	489	842
පාසල් සුනාමි වැඩසටහන සඳහා UNDP වෙතින් ආධාර	639	61
ව්‍යාපෘති පරිත්‍යාග බලමුලු ගැන්වීමෙන් සහය	-	1,187
අවම කිරීමේ ව්‍යාපෘතිවල 1% පරිපාලන පිරිවැය ප්‍රයෝජනයට ගැනීමේ ආදායම් පිළිගැනීම	55	3,449
ආසියා පැසිෆික් සන්ධානයේ සහාය	238	-
වත්කම් බැහැර කිරීමේ ලාභය	11	-
එකතුව	**149,197**	**152,045**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020

සටහන 16 - වෙනත් ආදායම්

උප සටහන - 16:01 වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමවත් කිරීම

ලබාදුන් වත්කම්	**2020.01.01** දිනට මුළු වියදම	එකතු කිරීම් / ආයෝජන වසර තුළ	පෙර වර්ෂයේ ගැලපීම්	**2020.12.31** දිනට මුළු වියදම
	RS. '000	**RS. '000**	**RS. '000**	**RS. '000**
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	426,287			426,287
කාර්යාල උපකරණ	5,916			5,916
ගෘහ භාණ්ඩ සහ උපාංග	559			559
මෝටර් වාහන	259,413			259,413
විදුලි සංදේශ උපකරණ	1,547,757			1,547,757
පරිගණක සහ උපාංග	66,763			66,763
මෝටර් රථ - වෙනත් භාණ්ඩාගාරය	31,675			31,675
එකතුව	**2,338,370**	**-**	**-**	**2,338,370**

ක්‍රමක්ෂය	**2020.01.01** දිනට සමුච්චිත ශේෂය	වසර සඳහා ක්‍රමක්ෂය	පෙර වර්ෂයේ ගැලපීම්	**2020.12.31** දිනට සමුච්චිත ශේෂය
මෝටර් වාහන ICET	259,413	-	-	259,413
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු ICET	175,842	21,314	-	197,156
පරිගණක සහ උපාංග ICET	50,286	6,676	-	8,962
කාර්යාල උපකරණ ICET	5,732	184	-	5,916
විදුලි සංදේශ උපකරණ ICET	1,256,359	92,073	-	1,348,431
ගෘහ භාණ්ඩ සහ උපාංග ICET	503	56	-	559
මෝටර් රථ භාණ්ඩාගාරය වෙනත්	30,718	957	-	31,675
එකතුව	**1,778,853**	**121,260**	**-**	**1,900,112**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020

සටහන 17 - පරිපාලන වියදම්	**2020 Rs. '000**	**2019 Rs. '000**
<u>ක්ෂය වීම</u>		
ත්‍රිවිධ හමුදා නවාතැන් ගොඩනැගිල්ල	13	-
පරිගණක	7,772	9,342
මිනින්දෝරු ජනරාල් GIS දත්ත ක්‍රමක්ෂකරණය	856	856
කාර්යාල උපකරණ	4,392	3,853
වාහන	35,569	35,569
ගෘහ භාණ්ඩ සහ උපාංග	1,178	1,205
මෘදුකාංග ක්ෂය කිරීම	593	593
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	21,366	21,366
විදුලි සංදේශ උපකරණ	93,032	107,839
වාහන රක්ෂණය	1,119	899
වාහන අලුත්වැඩියාව	5,474	7,288
වාහන සේවා, නඩත්තු සහ වෙනත්	5,364	7,906
පැලෑටි යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් උපකරණ නඩත්තු කිරීම	4,825	21,287
ගොඩනැගිලි නඩත්තු කිරීම	1,799	-
<u>පුද්ගලික දීමනා</u>		
වැටුප් සහ වැටුප් වියදම් ගිණුම	124,550	116,580
රියදුරන්ට නිල ඇඳුම් දීමනා	156	152
අතිකාල වියදම්	19,373	17,120
DMC හි EPF දායකත්වය (12%)	18,813	18,185
වෙනත් දීමනා	31,909	36,692
DMC හි ETF දායකත්වය (3%)	4,703	4,546
ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	8,929	6,770
AMC ගෙවීම්	72	175
වෙනත් වියදම්	838	410
විදුලිය සහ ජලය	11,139	12,018
ආරක්ෂක සේවය	1,239	1,283
නීති ගාස්තු	-	16
ප්‍රවාහන ගාස්තු	43	92

සනීපාරක්ෂක සේවය	1,778	1,300
කුලී සහ දේශීය බදු	1,143	858
IMC ගෙවීම්	131	267
සම්මුඛ පරීක්ෂණ ආශ්‍රිත වියදම්	-	124
තැපැල් සහ විදුලි සංදේශ	16,015	18,032
වෙළඳ දැන්වීම	123	126
පරිවර්තන ගාස්තුව	152	346
වාර්ෂික විගණන ගාස්තු	465	539
සැපයුම්		
නැවුම් වියදම්	746	834
මුද්‍රණය, ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	7,013	11,083
පුවත්පත් සහ වෙනත්	133	170
ඉන්ධන වියදම්	9,496	10,262
ගමන් සහ යැපුම් වියදම් - විදේශ	860	3,333
ගමන් සහ යැපුම් වියදම් - ගෘහස්ථ	6,992	9,063
එකතුව	**450,163**	**488,379**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020	**2020**	**2019**
	Rs. '000	**Rs. '000**
සටහන 18 - අනෙකුත් වියදම්		
Oxfam ආධාරවලින් වියදම්	385	691
UNDP ආධාරවලින් වියදම්	-	260
තොරතුරු තාක්ෂණ සම්බන්ධ උපකරණ A/C	188	-
WHO වෙතින් වියදම්	1,348	2,410
SFDRR වෙතින් වියදම්	-	981
NDRSC වෙතින් වියදම්	2,317	4,114
CRIWMP හි වියදම් - DM අමාත්‍යාංශයෙන් අරමුදල්	489	732
පාසල් සුනාමි වැඩසටහන - I අදියර UNDP වෙතින් අරමුදල්	639	61
සම්මන්ත්‍රණ වැඩසටහන 2020 වියදම් - UNDP වෙතින් අරමුදල්**	1,808	-
ආසියා පැසිෆික් සන්ධානයේ (A-PAD) ආධාර වියදම්	238	-
පුහුණුව සහ දැනුවත් කිරීම සඳහා වියදම් WFP අරමුදල් **	2,000	-
පාසල් සුනාමි වැඩසටහන - II අදියර UNDP වෙතින් අරමුදල්	1,302	-
එකතුව	**10,714**	**9,249**

** 2015-2030 ආපදා අවදානම් අවම කිරීම සඳහා සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා පර්යේෂණ, විද්‍යාව සහ තාක්ෂණය ලබා ගැනීම සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා බහු-උපද්‍රව්‍ය පූර්ව අනතුරු ඇඟවීම් සහ ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2020 දී ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ලෝක ආහාර වැඩසටහන (WFP) යනාදිය ඉහත වැඩසටහන සහ ජාතික මට්ටමේ පාසල් චිත්‍ර තරඟ වැනි ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා සෘජුවම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත අරමුදල් ලබා දෙන ලදී. එමෙන්ම, තවත් බොහෝ NGO/INGOs ද ලබා දී ඇත. එම වැඩසටහන සඳහා ඔවුන්ගේ දායකත්වය, මුදල් ආකාරයෙන් නොව, සමහර ද්‍රව්‍ය සහ තාක්ෂණික සහාය ලබා දීම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. DMG/A/DMC/FS/2020/17 මගේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 අගෝස්තු ०५ දින

අධ්‍යක්ෂ ජනරාල්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.33,918,887 ක් වූ වත්කම් වර්ග 03ක වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ ඇස්තමේන්තු කර නැවත සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල යෙදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව සේවක ප්‍රතිලාභ ආයු සණක තක්සේරු ක්‍රමය (Actuarial valuation Method) අනුව ගණනය කර පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කළ යුතු වුවද, ආයතනය විසින් රු.47,970,000 ක පාරිතෝෂික වෙන් කිරීම් ප්‍රමිතියේ සඳහන් නියමයන්ට අනුව සිදු කර නොතිබුණි.

(ඇ) මධ්‍යස්ථානය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයක් වන ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් සහ වෙනත් දේශීය හා විදේශීය ආයතන මගින් ප්‍රාග්ධන ප්‍රදානයන් ලබාදී තිබුණ ද එම අරමුදල් ලැබීම් හා අදාල වැය දැරීම් සිදුකිරීම් සම්බන්ධ වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන මගින් දරනු ලබන ප්‍රාග්ධන වැය වියදම්වල ස්වභාවය අනුව ක්‍රමානුකූල පදනමක් මත ගිණුම්වලින් ලියා හැරීමට කටයුතු නොකර වාර්ෂිකව දරනු ලබන වියදම් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂය තුල මෙසේ ප්‍රාග්ධන ප්‍රදාන වලින් අඩුකර දක්වා තිබුණු මුදල පිළිවෙලින් රු. මිලියන 53.6 ක් හා රු. මිලියන 219.9 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ආයතන වලින් ලැබී තිබුණු රු.මිලියන 16.24 ක ප්‍රාග්ධන ප්‍රදාන ස්කන්ධය/ශුද්ධ වත්කම් යටතේ පෙන්නුම් කිරීමට කටයුතු නොකර නැවත ආපසු ගෙවීමේ වගකීමක් නොමැතිව දිගුකාලීන ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2020 අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නැත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මධ්‍යස්ථානය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් කරුණු හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ	
(i) මු.රෙ.104 (1)	හානියක් සිදු වූ වාහාම එහි ප්‍රමාණය ,හේතු හා වගකිව යුත්තන් නිශ්චය කර ගැනීම සඳහා මූලික පරීක්ෂණ ආරම්භ කල යතු වුවත් 2018 සිට 2020 අගෝස්තු දක්වා වාහන අනතුරු 11 ක් සම්බන්ධයෙන් එසේකර නොතිබුණි.
(ii) මු.රෙ.104 (3)	අලාභ සම්බන්ධව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 ට වැඩි ප්‍රමාදයක් සිදුවෙනම්

	ප්‍රාරම්භක වාර්තාවක් එවිය යුතු වුවද වාහන අනතුරු 15 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.
(iii) මු.රෙ.104 (4)	2015 සිට 2017 වර්ෂයට අදාල වාහන අනතුරු 33 ක් සම්බන්ධයෙන්ද 2018 සිට 2020 අගෝස්තු දක්වා වාහන අනතුරු 31 ක් සම්බන්ධයෙන්ද 2021 පෙබරවාරි 17 දින වන විටත් පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(iv) මු. රෙ. 105	2019 වර්ෂයේ සිට වාර්ෂික තොග සමීක්ෂණයේදී හඳුනාගත් යල්පැන ගිය හා විනාශ කළ යුතු භාණ්ඩ, අයිතම 409 ක ඌණතාවයක් හා අස්ථානගත වූ භාණ්ඩ වෙනුවෙන් ගතයුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(v) මු.රෙ.110	හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි
(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	මධ්‍යස්ථානය විසින් 2014 සිට 2017 දක්වා වාර්ෂික වාර්තා 2021 මාර්තු 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මධ්‍යස්ථානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී රු. 1,052,460 ක් වැය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) පරිදි විධිමත් ගිවිසුමකින් අත්සන් කර නොතිබුණි. යන්ත්‍ර සවිකර ක්‍රියාත්මක කිරීමට පෙර ගිවිසුමකින් තොරව සම්පූර්ණ මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම මතභේදයට තුඩුදෙන කරුණක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

3. වෙනත් කරුණු

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.මිලියන 1034.39 ක වියදමින් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2010 වර්ෂයේදී ඉදිකර තිබුණු නමුත් එම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත නිත්‍යානුකූල පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සමාලෝචිත වර්ෂ අවසාන වන විටත් පිළියෙල කර අවසන් කර නොතිබුණු අතර මානව සම්පත් ප්‍රතිපත්ති සකස් කිරීමේ කටයුතු 2021 මාර්තු 30 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) 2020 පෙබරවාරි 13 දිනැති ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ උපදෙස් මාලාවේ (1) ඡේදය පරිදි තෝරාගනු ලබන ව්‍යාපෘතියට අදාල වගකිව යුතු අනෙකුත් රාජ්‍ය ආයතනවලට එකී අවදානම් අවම කිරීම සඳහා ප්‍රමාණවත් භෞතික හා මූල්‍ය සම්පත් නොමැති බවට එම ආයතන විසින් සහතික කර ඉල්ලීමක් කළ යුතුය. එසේ වුවත්, එවැනි ඉල්ලීම් කිරීමකින් තොරව රු. 29,958,885 ක ප්‍රතිපාදන ව්‍යාපෘති 26 ක් සඳහා විවිධ රාජ්‍ය ආයතනවලට ලබාදී තිබුණි.

(ඈ) ව්‍යාපෘතියක් අවසන් කළ පසු එය සාර්ථකව ගිවිසුම් ප්‍රකාරව නියමිත ප්‍රමිතිය ප්‍රකාරව වැඩ අවසන් කළ බවට කාර්මික නිලධාරි හෝ අදාල නිලධාරීන්ගෙන් සහතිකයක් ලබා දිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වටිනාකම .13,782,677 වූ ව්‍යාපෘති 11 ක අවසන් සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුනු අතර, වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද රු.2,350,000 ක ප්‍රතිපාදන මුදාහල ව්‍යාපෘතීන් 03 ක ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඉ) ශ්‍රී ලංකාව වටා දිස්ත්‍රික් 14 ක ස්ථාපිත කර ඇති පුර්ව් අනතුරු ඇඟවීමේ කුළුණු 77 පුනරුත්තාපනය හා නඩත්තු කටයුතු සඳහා පුද්ගලික ආයතනයක් සමග රු.134,746,418 ක ගිවිසුමකට එලඹ තිබුණි. මෙම කාර්යය නියමිත කාලය තුල ඉටු කර නොතිබුණු බැවින් දින දිර්ඝ කිරීම් කර තිබුණි. ගිවිසුමේ 02 (A) 01 ඡේදය ප්‍රකාරව අලුත්වැඩියා හා නඩත්තු කටයුතු කළ යුතු කොටස් පිළිබඳ තොරතුරු ගිවිසුම අත්සන් කිරීමට පෙර සැපයුම්කරු වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සැපයුම්කරු විසින් සිදුකරන අළුත්වැඩියා කටයුතු සත්‍ය වශයෙන්ම සිදු කරන ලද්දේද යන්න තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි. විගණනයට ලද තොරතුරු අනුව දැනට රු.89,764,707 ක් වැය තිබුණ ද කුළුණු 77 ම වන්දිකා තාක්ෂණය අක්‍රියව පවතින බැවින් මෙම කාර්යෙන් බලාපොරොත්තු වූ කුළුණු 77 ක්‍රියාකාරී තත්වයෙන් පවත්වාගෙන යාම සාර්ථක වී නොතිබුණි.

(ඊ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධන කිරීමට 2008 වර්ෂයේ සිට සිදු කර තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන තෙක් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(උ) ආපදා කළමනාකරණය සඳහා බහුවිධ අවදානම් පැහිකඩ සැකසීම සඳහා 2016 සිට 2019 කාල සිමාව සඳහා භාණ්ඩාගාරයෙන් රු.මි.247 ක මුදලක් වෙන්කර දී තිබුණ අතර එයින් රු.මිලියන 201 ප්‍රතිපාදන මෙම කාර්ය සඳහා ලැබී තිබුණි. එසේ වුවත්, මෙම කාර්ය ඉටුකර නොතිබුණු අතර, ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 53 ක් අදාල අරමුණින් බැහැරව වැයකර තිබුණි.

(ඌ) 2020 දෙසැම්බර් 31 දිනට සංවිධානයේ අනුමත කාර්යය මණ්ඩල නිලධාරීන් 465ක් වුව ද සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 304 ක් වූ බැවින් පුරප්පාඩු 161ක් ඇතිවී තිබුණි. එසේ වුවත්, මෙම පුරප්පාඩු පිරවීමට හෝ මානව සම්පත් සැලැස්ම සංශෝධනය කිරීමට හෝ මධ්‍යස්ථානය කටයුතු කර නොතිබුණි.

විගණකාධිපති
ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න